As part of the source separation trial planned for 2006-2008, one or more centralised sorting/storage centres will be established to which recyclable wastes collected at source will be taken for further sorting and storage prior to sale. This system will be expanded in the long term, if the source separation trial is successful.

#### 5.2.5.2 Schedule

| Code | Activities | 03 | 04 | 05 | 06 | 07 | 08 | 09 | 10 | 11 | 12 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 510 | Assistance to ORDE | XX | XX | X | X | X | X | X | X | X | X |
| 520 | Additional compost facilities | | | | XX | X | R | **Possible additional compost facilities** | | | |
| 530 | Biogas units | | | | XX | XX | **Decision to proceed depends on feasibility study results** | | | | |
| 540 | Establishment of sorting/storage centres | | | | XX | X | X | XX | X | X | X |

**Legend:** Concentrating: XX ; daily operation: X, Review: R

## 5.2.6 Item 600: Improved Final Disposal

#### 5.2.6.1 Description

**610. Proper Management of Existing Sites**

Until a new sanitary landfill site is developed in 2-3 years time, UCC are proposing to maximise the amount of garbage sent to ORDE for composting and to continue the present system of landfilling for

[24] Total cost should include both depreciation of the investment cost and ongoing operation and maintenance costs.

the residual garbage, except some criteria will be applied for selecting any future temporary disposal site and some environmental protection measures will be taken as listed below.

Any future site to be used for temporary landfilling will be:

- At least 50m distance from the lagoon or sea.
- At least 10m distance from the nearest residences, unless written permission is obtained from any people residing in closer proximity than this.
- At least 25m from any wells from which water is extracted for potable use.
- At least 50m from any protected area or conservation area.
- The PHI or one of the supervisors will be made responsible for checking the condition of all landfill sites at least three times per week.
- Soil cover of 100-150mm will be applied daily to all landfill sites to control odour, pests and prevent fire/smoke and waste scattering.
- Pesticide spraying may be applied over the landfilling areas for pest control, as required.
- A landfill monitoring committee will be established to check landfilling conditions on a monthly basis.
- Fires will be banned at any landfill sites.

**620. Procurement, Development, Construction and Operation of New Landfill Site**

UCC recognises the need to urgently identify and develop a new landfill site. This involves the following steps:

**621.** Procurement of appropriate land and resettlement of illegal occupants on this land. UCC have 22ha of land vested in them in the Deduruoya area (outside current urban limits but inside additional area to be added by 2006). 6ha of this land has been designated for additional composting facilities and a disposal site. Some people are illegally occupying this land and UCC is currently preparing a plan for their resettlement by 2004-05.

**622.** Surveying, engineering and environmental investigations together with public consultation, in accordance with CEA requirements, to confirm site acceptability and develop landfilling design, construction and operation plans.

**623.** Construction of sanitary landfill.

**624.** Commencement of operations of new landfill.

This whole process is expected to take around 2-3 years, with the new landfill commencing operations in early 2006.

Note that MSW may also be composted as a means of pre-treating the waste going to disposal so as to reduce its weight, volume and to stabilise it, reducing its negative environmental effects. In this case, mixed MSW is composted, producing a much lower quality compost which is subsequently landfilled

(pre-composting). Pre-composting will reduce the land requirement for landfilling and/or extend the lifetime of a landfill site. Pre-composting may be considered as an alternative to direct disposal for the new landfill. In this case, if the total cost of pre-composting + disposal (collection and transportation, pre-composting and disposal) is less than the total cost of disposal (collection, transportation and disposal), pre-composting will be introduced.

#### 5.2.6.2 Schedule

| Code | Activities | 03 | 04 | 05 | 06 | 07 | 08 | 09 | 10 | 11 | 12 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 610 | Improvement of existing and future temporary landfill sites | XX | XX | XX | | | | | | | |
| 620 | New Landfill Site | | | | | | | | | | |
| 621 | Procurement of 6ha of land at Deduruoya and resettlement of people from this land | | XX | XX | | | | | | | |
| 622 | Development of new landfill (may include pre-composting) | | XX | XX | | | | | | | |
| 623 | Construction of new landfill | | | XX | | | | | | | |
| 624 | Sanitary landfill operation at new site | | | | XX | XX | X | X | X | X | X |

**Legend:** Concentrating: XX ; daily operation: X, Review: R

## Attachment 1 : Responsibilities of UCC Staff and Council Members in Relation to SWM

| Position | Responsibilities |
|---|---|
| Chairman | Overall responsibility for SWM.<br>Advice on SWM policy and legal issues.<br>Enforcement of SWM policies and regulations. |
| Nominated Council Member (SWM)[2] | Implementing Council policies and decisions of the Council and Chairman on health/SWM matters.<br>Issuing work instructions for health/SWM related works from time to time, as directed by the chairman.<br>Monitoring work performance of PHI (SWM) and Environment Officer. |
| PHI (SWM)[3] | Planning, directing and controlling the day to day SWM works, including garbage collection, transportation and disposal; street sweeping, drain cleaning, market cleaning and various other works.<br>Liaison with Environment Officer on SWM issues, including the resolution of complaints and problems.<br>Liaison with Transport Officer on issues relating to all SWM vehicles[4].<br>Provision of required SWM data/information to clerical staff (e.g. staff attendance, equipment in service, problems/complaints).<br>Enforcement of SWM policies and regulations.<br>SWM cost control and analysis. |
| Environment Officer | Planning, conduct and evaluation of education/awareness activities for all people living or working in Chilaw.<br>Monitoring the work performance of the PHI (SWM) and Supervisors.<br>Co-ordination of the community animator system.<br>Liaison with PHI (SWM) on SWM issues, including resolution of complaints and problems.<br>Provision of required SWM data to clerical staff (e.g. problems, complaints).<br>Enforcement of SWM regulations. |
| Transport Officer | Operation and maintenance of all UCC vehicles[4]. |
| MOH (under central govt) | Primarily, liaison with UCC on infectious disease prevention works.<br>Exchange of information on SWM matters. |
| Senior Supervisor | Supervision of labourers involved in SWM works.<br>Planning of weekly Saturday cleanup activities (Shramadana).<br>Reporting to PHI (work done, cleaning/staff/vehicle problems, fuel consumption, special cleaning work, etc.).<br>Provision of required SWM data/information to clerical staff (e.g. staff attendance; number of loads collected, taken to ORDE and disposed of; street sweeping (km); and drain cleaning (km)). |
| Supervisors | Supervision of labourers involved in SWM works.<br>Reporting to PHI (work done, cleaning/staff/vehicle problems, fuel consumption, special cleaning work, etc.).<br>Provision of required SWM data/information to clerical staff (e.g. staff attendance; number of loads collected, taken to ORDE and disposed of; street sweeping (km); and drain cleaning (km) in their work areas). |
| Drivers | Driving and care of UCC SWM vehicles, including keeping a running chart record book and the purchase of diesel from public petrol sheds. |
| Labourers | Garbage collection.<br>Daily removal of litter/debris from drains. Brushing will be done by shramadana every two weeks.<br>Daily sweeping of allocated streets.<br>Daily cleaning of Chilaw's public markets.<br>Grass cutting/weeding along the roadside and in public places, as required. |
| Clerks | SWM administration, record keeping and accounts.<br>Allowing visitors to enter the Environment Education Centre when the Environment Officer is absent from UCC premises. |

**Notes:**

1. All UCC staff may also be required to undertake additional tasks allocated by the Chairman, Secretary or nominated Council member (SWM).
2. Chairman's SWM authority delegated to the nominated Council member. However, all other Council members are expected to be involved in SWM, as part of their position.
3. The Chairman recommends that the PHI (SWM) should live in official quarters within Chilaw town, as SWM is an essential service. Hence the PHI should be prepared to be available 24hrs/day.
4. At present, the Transport Officer is responsible for the operation and maintenance of all UCC vehicles. However, if Chilaw's urban limits are expanded in 2006, these vehicles may be brought directly under the control of the PHI or other officer in the Health section.

## Attachment 2 : Recommended Areas for Privatisation of Garbage Collection Services

| Place | Garbage Collection | Street sweeping | Drain cleaning | Grass cutting and weeding |
|---|---|---|---|---|
| Public market | Yes | Yes | Yes | |
| Private bus stand | Yes | Yes | Yes | |
| Kurunegala Rd | Yes | Yes | Yes | Yes |
| Colombo Rd | Yes | Yes | Yes | Yes |
| Puttalam Rd | Yes | Yes | Yes | Yes |
| Bazaar St, Corea Ave, Edmund Peiris Mw, Jetty St | Yes | Yes | Yes | Yes (Corea Ave only) |
| Area within Corea Ave, Jetty St, Cathedral Rd and Puttalam Rd | Yes | Yes | Yes | Yes (Cathedral Rd only) |
| Malaria drain | | | Yes | |
| CML drain | | | Yes | |

**Attachment 3 : Provisional list of Places that may be Charged for Garbage Collection**

| Category | Place |
|---|---|
| Large waste generators (>20kg/d) | Telecom<br>Dhammika Furniture<br>Main Post Office<br>National Savings Bank,<br>Suhadha Pharmacy<br>Cargills Food City<br>Serandib Chinese Restaurant<br>Chilaw Rest House<br>Chilaw Chinese Restaurant.<br>Skyline<br>Silva Hotel<br>Nisamiya Hotel<br>Muththu Hotel<br>Mannar Hotel<br>Siripala Hotel<br>Master Motors (possibly some other garages) |
| Medium waste generators (10-20kg/d) | Sudasuna Printers<br>Mangalika Hotel<br>Bank of Ceylon<br>The Finance Company (Puttalam Rd)<br>Sri Lankan Fisheries Board<br>Ice factory (Rediwella)<br>Justin Cooray Boatyard<br>Mid-Garment Factory |
| Industries producing hazardous wastes | Neil Marine Boatyard<br>Justin Cooray boatyard |
| Medical Clinics | Chilaw Clinic<br>St Marys Nursing Home<br>Suwana<br>Dr Titus Fernando<br>Dr DK Premasiri<br>Dr Premaratne<br>Dental Clinic |

ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA)
ස්වදේශ කටයුතු ,පළාත් සභා, හා පළාත් පාලන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# ශ්‍රී ලංකාවේ ද්විතියික
# නගර සඳහා
# ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
# වැඩි දියුණු කිරීමේ අධ්‍යයනය

## හළාවත නගරය සඳහා ක්‍රියාකාරී සැළැස්ම

අවසන් වාර්තාව

වෙළුම V - 2 (අ)

ප්‍රධාන වාර්තාව



2003 දෙසැම්බර

සීමාසහිත කොකුසායි කෝග්යෝ සමාගම.

# පටුන

1 පරිච්ඡේදය පසුබිම ........ 1-1

1.1 හැඳින්වීම........ 1-1
1.2 මූලික තොරතුරු පත්‍රය........ 1-1
1.0 සාමාන්‍ය දත්ත ........ 1-1
1.3 ස්වාභාවික හා සමාජීය තත්ත්වය ........ 1-2
1.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධ ප්‍රධාන කරුණු........ 1-2

2 පරිච්ඡේදය ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයේ වත්මන් තත්ත්වය ........ 2-1

2.1 වත්මන් අපද්‍රව්‍ය ප්‍රවාහය ........ 2-1
2.1.1 අපද්‍රව්‍ය ප්‍රවාහයේ එන පාරිභාෂිත වචන මාළාව ........ 2-1
2.1.2 අපද්‍රව්‍ය මූලාශ්‍ර........ 2-2
2.1.3 අපද්‍රව්‍ය උත්පාදනය........ 2-2
2.1.4 අපද්‍රව්‍ය ප්‍රවාහය බෙදී යන අයුරු ........ 2-5
2.1.5 අපද්‍රව්‍ය ප්‍රවාහය ........ 2-9
2.1.6 බැහැර කරනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය බෙදා දැක්වීම ........ 2-11
2.2 හළාවත නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආයතනික සැකැස්ම ........ 2-13
2.2.1 ආයතනික ව්‍යුහය ........ 2-13
2.2.2 අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා භාවිතා කරනු ලබන උපකරණ........ 2-17
2.2.3 හ.න.ස. අපද්‍රව්‍ය කළමනාකරණ සේවා කම්කරු පිරිස සහ උපකරණ........ 2-17
2.2.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වියදම්........ 2-19
2.2.5 අපද්‍රව්‍ය එකතු කිරීමේ හා බැහැර කිරීමේ ගාස්තු........ 2-19
2.2.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු-ව්‍යවස්ථා ........ 2-20
2.2.7 හළාවත නගර සභා වැඩපොල ........ 2-20
2.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක සංරචක ........ 2-21
2.3.1 බැහැර කිරීම, එකතු කිරීම හා ප්‍රවාහනය ........ 2-21
2.3.2 සැකසීම් හා ප්‍රතිකර්ම යෙදීම ........ 2-24
2.3.3 අවසන් බැහැර කිරීම ........ 2-26
2.4 සම්පත් නැවත ලබා ගැනීම ........ 2-26
2.5 සමාජීය කරුණු ........ 2-27
2.5.1 පවුල් සමීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා ........ 2-27
2.5.2 වාණිජ,කර්මාන්ත හා ආයතනික සමීක්ෂණ ප්‍රතිඵල........ 2-31
2.5.3 අපද්‍රව්‍ය එකතු කිරීමේ නියුතු සේවකයින්ගේ ආකල්ප........ 2-32
2.5.4 දැනුවත් කිරීමේ වැඩසටහන් හා පාරිසරික අධ්‍යාපනය ........ 2-33

3 පරිච්ඡේදය ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයේ වත්මන් ස්වභාවය ඇගයීම ........ 3-1

3.1 සෞඛ්‍යමය දෘෂ්ටිකෝණය........ 3-1
3.1.1 හළාවත නගර සභාව විසින් ඇතැම් ක්ෂේත්‍ර තුළ මනා ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරයි. ........ 3-1
3.1.2 සම්පත් නැවත ලබා ගැනීම ඉතා හොඳින් සිදු වේ. ........ 3-1
3.2 ගැටළු........ 3-2
3.2.1 ඉතා බරපතල ගැටළු........ 3-2
3.2.2 බරපතල ගැටළු ........ 3-4
3.2.3 බරපතල නොවන ගැටළු........ 3-5

4 පරිච්ඡේදය නියමු ව්‍යාපෘතිය........ 4-1

4.1 පදනම........ 4-1
4.2 අරමුණු........ 4-1
4.3 විස්තරය........ 4-2
4.3.1 කළමනාකාරිත්ව ධාරිතාවය ශක්තිමත් කිරීම ........ 4-2
4.3.2 අපද්‍රව්‍ය එකතු කිරීමේ කටයුතු වැඩි දියුණු කිරීම ........ 4-4
4.3.3 පරිසර අධ්‍යාපනය ........ 4-5
4.4 ඇගයීම ........ 4-5
4.4.1 සාමාන්‍ය........ 4-5
4.4.2 කළමනාකාරිත්ව ධාරිතාවය ශක්තිමත් කිරීම ........ 4-6
4.4.3 කසළ එකතු කිරීම වැඩි දියුණු කිරීම........ 4-7
4.4.4 පරිසර අධ්‍යාපනය ........ 4-8

5 පරිච්ඡේදය ක්‍රියාකාරී සැළැස්ම........ 5-1

5.1 දළ සැකසුම ..... 5-1
5.1.1 දැක්ම ..... 5-1
5.1.2 අභිප්‍රාය ..... 5-1
5.1.3 ප්‍රධාන අභිමතාර්ථයන් ..... 5-1
5.1.4 සම්පත් බෙදා හැරීමේ ප්‍රතිපත්තිය ..... 5-2
5.1.5 මූලික ක්‍රමෝපායයන් ..... 5-3
5.1.6 සමස්ත ඉලක්කයන් ..... 5-3
5.2 ක්‍රමෝපායන් හා ක්‍රියාමාර්ග ..... 5-4
5.2.1 අයිතමය 100. ආයතනිකමය ප්‍රතිසංස්කරණය හා ශක්තිමත් කිරීම ..... 5-4
5.2.2 අයිතමය 200: අපද්‍රව්‍ය අවම කිරීම (3 R ) ..... 5-9
5.2.3 අයිතමය 300 අධ්‍යාපනය හා දැනුවත් කිරීම හා පුහුණුව ..... 5-11
5.2.4 අයිතමය 400. තාක්ෂණික පද්ධතිය ..... 5-15
5.2.5 අයිතමය 500 අපද්‍රව්‍ය සැකසීම හා ප්‍රතිකර්ම කටයුතු දියුණු කිරීම ..... 5-18
5.2.6 අයිතමය 600 වැඩි දියුණු කළ අවසන් බැහැරලීම ..... 5-20

## වගු ලැයිස්තුව

* 1-1 වගුව: හලාවත නගරයේ භූමි පරිභෝජනය ....................1-2
* 2-1 වගුව: අපද්‍රව්‍ය ප්‍රවාහයේ එන පාරිභාෂිත වචන මාලාව ....................2-1
* 2-2 වගුව අපද්‍රව්‍ය උත්පාදන ප්‍රධාන මූලාශ්‍ර ....................2-2
* 2-3 වගුව ඇස්තමේන්තු කරන ලද අපද්‍රව්‍ය උත්පාදන ප්‍රමාණයන්(2002) ....................2-4
* 2-4 වගුව: අපද්‍රව්‍ය ප්‍රවාහයේ ක්ෂේත්‍ර පරීක්ෂණ ප්‍රතිඵල (2002) ....................2-5
* 2-5 වගුව : ප්‍රතිචක්‍රීකරණ දත්ත සාරාංශය ....................2-8
* 2-6 වගුව : හලාවත නගර සභාවේ ඝ.අ.ක. වාහන පරිමා සහ පැටවිය හැකි ප්‍රමාණ ....................2-9
* 2-7 වගුව : අපද්‍රව්‍ය ප්‍රවාහය බෙදා දැක්වීම (2002) ....................2-9
* 2-8 වගුව: බැහැර කිරීමට ඇති අපද්‍රව්‍ය ප්‍රමාණ (2002) ....................2-12
* 2-9 වගුව : හ.න.ස.- අපද්‍රව්‍ය කළමනාකරණ අංශයේ කාර්ය මණ්ඩලය සහ උපකරණ බෙදා දැක්වීම ....................2-16
* 2-10 වගුව : අපද්‍රව්‍ය කළමනාකරණ වාහන සමූහය සහ ඒ සඳහා උපකාරී වන උපකරණ ....................2-17
* 2-11 වගුව : වාහන කම්කරුවන් සහ උපකරණ පිළිබඳ තොරතුරු ....................2=17
* 2-12 වගුව: හලාවත නගර සභා අයවැයට අනුව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පිරිවැය හා සේවක සංඛ්‍යාව (2002).2-19
* 2-13 වගුව හලාවත නගරයේ සම්පත් ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන් පිළිබඳ සාරාංශය ....................2-26
* 2-14 වගුව: පවුල් පිළිබඳ සාමාන්‍ය දත්ත ....................2-27
* 4-1 වගුව නියමු ව්‍යාපෘති දළ සැකසුම ....................4-1
* 4-2 වගුව ම.සෞ.ප. හා පරිපාලක පුහුණුව පිළිබඳ සාරාංශය ....................4-3
* 5-1 වගුව: සමස්ත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ඉලක්ක ....................5-3
* 5-2 වගුව ශ්‍රම බලකාය ව්‍යාප්ත කිරීමේ යෝජිත සැළසුම ....................5-5
* 5-3 වගුව: 5-3 කළමනාකරණ දියුණුව සඳහා විශේෂිත යෝජනා ....................5-6
* 5-4 වගුව ඝ.අ.ක. වියදම් තාවකාලිකව බෙදී යාම ....................5-8
* 5-5 වගුව 2004 වසර සඳහා ඝ.අ.ක. අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන ....................5-14
* 5-6 වගුව කසළ බැහැර කිරීම හා එකතු කිරීම වැඩි දියුණු කිරීමේ විශේෂිත ක්‍රම ....................5-15

## රූප සටහන් ලැයිස්තුව

** 2-1 රූප සටහන: හලාවත නගර සීමාව තුළ විවිධ මූලාශ්‍රයන් මගින් සිදු වන අපද්‍රව්‍ය උත්පාදනය (2002) ....................2-4
** 2-2 රූප සටහන: හලාවත නගර සභාවේ වර්තමාන අපද්‍රව්‍ය ප්‍රවාහය (2002) ....................2-11
** 2-3 රූප සටහන : දිනපතා බැහැර කිරීමට ඇති ප්‍රමාණ (2002) ....................2-12
** 2-4 රූප සටහන හලාවත නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ ආයතනික සටහන ....................2-15
** 2-5 රූප සටහන: හලාවත නගර සභාවේ ඝ.අ.ක. වාහනවල වත්මන් එකක මිළ ....................2-23
** 2-6 රූපසටහන: අපද්‍රව්‍ය එකතු කිරීමේ සේවාව පිළිබඳ තෘප්තිමත්භාවයට පත් වී ඇති ප්‍රමාණය ....................2-28
** 2-7 රූප සටහන: බැහැර කිරීම හා එකතු කිරීම අතර වෙනස ....................2-29
** 2-8 රූපසටහන: අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා බහුලව භාවිතා කරන ක්‍රම ....................2-29
** 2=9 රූපසටහන: හලාවත න.ස. වේ සංවිධානමය සටහන (ඝ.අ.ක. කටයුතු ඇතුළත් නොකර) ....................2=34
** 5-1 රූප සටහන: සංශෝධිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යුහය ....................5-5

## කෙටි යෙදුම් ලැයිස්තුව

| | |
|---|---|
| CDA | ප්‍රජා සංවර්ධන සහායක (Community Development Assistant) |
| CDO | ප්‍රජා සංවර්ධන නිලධාරී (Community Development Officer) |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය (Central Environment Authority) |
| SPHI | ජ්‍යෙෂ්ඨ මහජන සෞඛ්‍ය පරීක්ෂක (Senior Public Health Inspector) |
| CUA | හලාවත නගර සභා ප්‍රදේශය (Chilaw Urban Area) |
| DEO | ප්‍රාදේශීය පරිසර නිලධාරී (Divisional Environmental Officer) |
| DF/R | අවසන් වාර්තා කෙටුම්පත (Draft Final Report) |
| EIA | පාරිසරික බලපෑම් ඇගයීම (Environmental Impact Assessment) |
| F/S | ශක්‍යතා අධ්‍යයනය(Feasibility Study) |
| GDP | දළ දේශීය නිෂ්පාදනය (Gross Domestic Product) |
| IC/R | මූලික වාර්තාව (Inception Report) |
| IDP | වසංගත රෝග මර්ධනය (Infectious Disease Prevention) |
| IEE | මූලික පාරිසරික පරීක්ෂණය (Initial Environmental Examination) |
| JBIC | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා බැංකුව (Japan Bank for International Cooperation) |
| JICA | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (Japan International Cooperation Agency) |
| MOH | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (Medical Officer of Health) |
| MGTP | කළමනාකරණ සැලැස්ම (Management Plan) |
| M/M | රැස්වීම් වාර්තා (Minutes of Meeting) |
| MOHALG | ස්වදේශ කටයුතු පළාත් සභා, හා පළාත් පාලන අමාත්‍යාංශය (Ministry of Home Affairs, Provincial Councils and Local Government) |
| MSW | නාගරික ඝන අපද්‍රව්‍ය (Municipal Solid Waste) |
| MSWM | නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය (Municipal Solid Waste Management) |
| NGO | රාජ්‍ය නොවන ආයතන (Non-Governmental Organization) |
| O&M | මෙහෙයුම් හා නඩත්තු (Operation and Maintenance) |
| PDM | ව්‍යාපෘති සැලසුම් (Project Design Matrix) |
| PHI | මහජන සෞඛ්‍ය පරීක්ෂක (Public Health Inspector) |
| POS | මහජන මත විමසීමේ සමීක්ෂණය (Public Opinion Survey) |
| P/R | ප්‍රගති වාර්තාව (Progress Report) |
| SLILG | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (Sri Lanka Institute of Local Governance) |
| S/W | කාර්යය අභිප්‍රාය (Scope of Work) |
| SWM | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය (Solid Waste Management) |
| CUC | හලාවත නගර සභාව(Chilaw Urban Council) |
| WGR | අපද්‍රව්‍ය උත්පාදන ප්‍රතිශතය (Waste Generation Rate) |
| WTP | මුදල් ගෙවීමට ඇති කැමැත්ත (Willingness To Pay) |

# 1 පරිච්ඡේදය පසුබිම

## 1.1 හැඳින්වීම

මෙම සැළසුම JICA ආයතනයේ තාක්ෂණික සහාය ඇතිව හළාවත නගර සභාව විසින් පිළියෙළ කරන ලද්දකි. අධ්‍යයනයේ දී ගන්නා ලද සියළුම තීරණයන් නගර සභාව විසින් ගනු ලැබිණ.

## 1.2 මූලික තොරතුරු පත්‍රය

| | | |
|---|---|---|
| **1.0** | **සාමාන්‍ය දත්ත** | |
| 1.1 | පළාත | වයඹ |
| 1.2 | දිස්ත්‍රික්කය | පුත්තලම |
| 1.3 | පළාත් පාලන ආයතනයේ තත්ත්වය | නගර සභා |
| 1.4 | පිහිටීම | කොළඹට කි.මී. 80ක් උතුරින් බටහිර වෙරළ තීරයේ පිහිටා ඇත. |
| 1.5 | භූ විෂමතාවය | ප්‍රධාන භූමිය හා පටු වෙරළ තීරයක් වශයෙන් ප්‍රදේශ දෙකක් වෙන්ව හඳුනාගත හැකි අතර මේ දෙක කළපුවකින් වෙන් කර දැක්වේ.ඉතාම පැතළි හා පහත්බිම් රාශියකින් යුතු අතර පොල් වගාව බහුළ ප්‍රදේශයකි. |
| 1.6 | හළාවත නගර සභා බල ප්‍රදේශය | වර්ග කි.මී. 5.17(කළපු ප්‍රදේශය අත්හැර දළ වශයෙන් ව.කි.මී.4.49කි) |
| 1.7 | නගර සභාවේ නාගරික මන්ත්‍රීන් ගණන | 11 |
| **2.0** | **සමාජ-ආර්ථික දත්ත** | |
| 2.1 | මුළු ජනගහණය (2001) | 24,105 (2002 ඇස්තමේන්තුව = 24,539) |
| 2.2 | දෛනික පාවෙන ජනගහණය | 2000 (දළ වශයෙන්) |
| 2.3 | සාමාන්‍ය ජනගහණ ඝණත්වය | හෙක්ටයාර් 1/පුද්ගලයින් 53.7 (2001 දී දළ භූමි ප්‍රමාණය අනුව) |
| 2.4 | ජනගහණ වර්ධන වේගය | වසරකට 1.8% |
| 2.5 | ආසන්න පවුල් ඒකක සංඛ්‍යාව | 5,220 (2002 ජනගහණය JICA සමීක්ෂණ ප්‍රතිඵල වලින් බෙදා) |
| 2.6 | පවුලක සාමාජිකයන් ගණන | 4.7 (JICA සමීක්ෂණය -නිවාස 120 ක් සඳහා) |
| **3.0** | **සමස්ත හළාවත නගර සභාව පිළිබඳ දත්ත** | |
| 3.1 | සේවක මඩුල්ලට අනුමත මුළු සංඛ්‍යාව(2002) | 261 |
| 3.2 | මුළු අයවැය වියදම | 31,695,000 (2002) |
| **4.0** | **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය (SWM)** | |

| | | |
|---|---|---|
| 4.1 | එකතු කරන අපද්‍රව්‍ය ප්‍රමාණය (2002) | දිනකට ටොන් 11.9; වසරකට ටොන් 4,351 |
| 4.2 | ඝ.අ.ක. සඳහා අයවැය වියදම (2002) | 10,936,000 |
| 4.3 | ඝ.අ.ක. සඳහා අනුමත සේවක සංඛ්‍යාව: | 77 (2002 සඳහා) |
| 4.4 | ඝ.අ.ක. සේවකයින් ගණන මුළු සේවක සංඛ්‍යාවට අනුපාතය ලෙස: | 29.5% |
| 4.5 | ඝ.අ.ක. වියදම මුළු වියදමට දක්වන අනුපාතය | 34.5% |
| 4.6 | ඝ.අ.ක. ඒකපුද්ගල වියදම | වසරකට එක් පුද්ගලයෙකුට රු. 446 |
| 4.7 | ඝ.අ.ක. අපද්‍රව්‍ය ටොන් එකකට වියදම | ටොන් එකකට රු. 2,514 |

## 1.3 ස්වාභාවික හා සමාජීය තත්ත්වය

හලාවත නගරය පුත්තලම් දිස්ත්‍රික්කයේ දෙවැනි විශාල නගරය වේ. නගර මධ්‍යයෙන් දිව යන කළපුවකින් යුත් මෙය වෙරළබඩ පිහිටා ඇති නගරයකි. එහි පවත්නා දේශගුණය අතිශයින්ම වෙරළ කළාපීය එකකි. හලාවත නගර සභා බල ප්‍රදේශයේ ජීවත්වන, වැඩ කරන ජනගහණයෙන් 50% පමණ කෘෂිකර්මාන්තයේ හා ධීවර කර්මාන්තයේ නියුතු අය වේ. සැප්තැම්බර් මාසයේදී මුන්නේශ්වරම කෝවිලේ පවත්වන වාර්ෂික උත්සවය සඳහා සංචාරකයින් බොහෝ පිරිසක් නගරය වෙත පැමිණේ.

භූමි පරිභෝජනය පහතින් වගුගත කොට දක්වා ඇත.

* 1-1 වගුව: හලාවත නගරයේ භූමි පරිභෝජනය

| වර්ගීකරණය | ප්‍රදේශය (හෙක්ටයාර) | ප්‍රතිශතය (%) |
|---|---|---|
| නේවාසික | 272.00 | 53.57 |
| වාණිජ | 10.68 | 2.10 |
| පොදු/රජයේ | 22.07 | 4.35 |
| සුසාන භූමි | 4.6 | 0.91 |
| කර්මාන්ත | 1.86 | 0.37 |
| හිස් භූමි | 10.43 | 2.05 |
| පොල් වගාව | 12.35 | 2.43 |
| ඉස්සන් වගාව | 8.02 | 1.58 |
| විවෘත භූමි | 15.24 | 3.00 |
| ආගමික ස්ථාන | 6.82 | 1.34 |
| තෙත් බිම් | 18.05 | 3.56 |
| මාර්ග | 37.80 | 7.45 |
| ජලාශ(ප්‍රධාන වශයෙන් කළපු ) | 81.00 | 15.95 |
| මුඩු ඉඩම් | 6.80 | 1.34 |
| මුළු බිම් ප්‍රමාණය | 507.72 | 100.00 |

## 1.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධ ප්‍රධාන කරුණු

හලාවත නගරයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධවන ප්‍රධාන කරුණුවල පසුබිම අනුව,

හලාවත නගරය තරමක් විශාල බැවින් හා එහි පවතින මුහුද ආශ්‍රිත ප්‍රදේශය මෙන්ම කළපුවද ආරක්ෂා කරගනු වස් උසස් තත්ත්වයකින් යුත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සේවයක් සැපයිය යුතු වේ.

- හළාවත නගරය සමතළා භූමියක පිහිටි බැවින්, කසළ හා අනෙකුත් අපද්‍රව්‍ය නිසා මෙහි කාණු පද්ධතිය ඉතා ඉක්මනින් අවහිරවන අතර ඒ තුළින් සිදුවන  මහජන සෞඛ්‍ය ගැටළු හා හිරිහැරයන් වළක්වා ගැනීම සඳහා ක්‍රමවත් පිරිසිදු කිරීමක් අවශ්‍ය වේ.

- නගරය පුරාම විසිරී පවතින පහත් බිම්වල(අත්හැර දමන ලද ඉස්සන් පොකුණු හෝ වගුරු බිම්) අයිතිකරුවන්,  බොහෝ විට නගර සභාවේ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තම ඉඩම් ලබා දීමට ඉතා කැමැත්තෙන් හෝ උනන්දුවකින් සිටී. ඊට හේතුව ඒ තුළින් අඩු වියදමකින් තම ඉඩම් ගොඩකර ගැනීමේ අවස්ථාවක් ඔවුන්ට උදාවන බැවිනි. කෙසේ වෙතත් එවැනි ස්ථානයක් කසළ අපහරණය සඳහා යොදා ගැනීමට පෙර ඒ අවට පරිසරයට හා සමාජීය වටපිටාවට අහිතකර බලපෑමක් ඇති නොවන බවට වග බලා ගත යුතු වේ.

- හළාවත නගරයේ ගෙවතු අපද්‍රව්‍ය ප්‍රමාණයද ඉතා අධිකය. පොල් ගස් බහුළවීම හා නොයෙකුත් කාර්යයන් සඳහා (වැටවල් හා වහළ සඳහා) පොල් අතු භාවිතා කිරීම හා ඉන් අනතුරුව එවා ඉවත දැමීම මීට හේතුව වශයෙන් සඳහන් කළ හැකිය.

- හළාවත නගරය මුහුදට ඉතා ආසන්නව පිහිටි බැවින් ඝ.අ.ක. සඳහා ඇති උපකරණ(වාහන, කසළ බඳුන් ආදිය) මළ බැඳීමට ලක්වීම.

# 2 පරිච්ඡේදය ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයේ වත්මන් තත්ත්වය

## 2.1 වත්මන් අපද්‍රව්‍ය ප්‍රවාහය

"අපද්‍රව්‍ය ප්‍රවාහය" යනු උත්පාදනය වූ තැන් සිට අවසන් බැහැර කිරීම දක්වා සිදුවෙන ක්‍රියාවලිය "ගැලීමක" ආකාරයෙන් විස්තර කිරීමයි. එමගින් මෙම අධ්‍යයන පරාසය තුළ වූ විවිධ මූලාශ්‍රයන්ගෙන් උත්පාදනය වන අපද්‍රව්‍ය ප්‍රමාණයන් ගණනය කිරීම හා විස්තර කිරීමක් සිදු කරයි. එසේම අපද්‍රව්‍ය එකතු කිරීමේ ප්‍රමාණය, ප්‍රතිචක්‍රීකරණ ප්‍රමාණය හා බැහැර කරන ප්‍රමාණය ආදියේ විවිධ ස්වභාවයන් හා එවා ගණනය කර දැක්වීමද මෙතුළින් සිදු කෙරේ. අපද්‍රව්‍ය ප්‍රවාහය පිළිබඳව සැළකිළිමත්වීම වනාහි ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැළසුමක් සැදීමේදී සම්පූර්ණ කළ යුතු ඉතා වැදගත් කාරණාවන්ගෙන් එකකි. මෙම පරිච්ඡේදයේදී 2002 වසර සඳහා වූ අපද්‍රව්‍ය ප්‍රවාහය සාරාංශගත කර ඇති අතර වැඩි විස්තර උපකාරක වාර්තාවේ දක්වා තිබේ.

### 2.1.1 අපද්‍රව්‍ය ප්‍රවාහයේ එන පාරිභාෂිත වචන මාළාව

අපද්‍රව්‍ය ප්‍රවාහයේදී භාවිතා කරන වචන මාළාව හලාවත නගර සභා ප්‍රදේශයට ගැළපෙන අයුරින් පහත සඳහන් ආකාරයට නිරවචනය කර ඇත.

* 2-1 වගුව: අපද්‍රව්‍ය ප්‍රවාහයේ එන පාරිභාෂිත වචන මාළාව

| පාරිභාෂිත වචනය | විස්තර කිරීම/නිරවචනය |
|---|---|
| උත්පාදනය | මූලාශ්‍රවලදී නිපදවෙන සියළුම අපද්‍රව්‍ය |
| ස්ථානීය බැහැර කිරීම | අපද්‍රව්‍ය උත්පාදනය කරනු ලබන පුද්ගලයා විසින්ම තම පරිශ්‍රය තුළදීම සිදු කරන අපහරණය. මෙය වළ දැමීම හෝ පිළිස්සීම වේ. රෝහලක නම් දහනය කිරීම වැනි ක්‍රියාවලියක්. |
| ස්ථානීය කොම්පෝස්ට් සෑදීම | අපද්‍රව්‍ය උත්පාදනය කරනු ලබන පුද්ගලයා විසින්ම තම පරිශ්‍රය තුළදීකාබනික ද්‍රව්‍ය යොදා කොම්පෝස්ට් සෑදීමෙන් ප්‍රයෝජනවත් යමක් නිෂ්පාදනයක් කිරීම – කොම්පොස්ට් |
| බැහැර කිරීම | උත්පාදනය කරනු ලබන සියළුම අපද්‍රව්‍ය හෝ ඉන් කොටසක් එකතු කරගෙන යාම සඳහා පරිශ්‍රය තුළ (උදා. දේශීය හෝටල්, සමහර ආයතන) හෝ ඉන් බැහැරව (පාර අයිනේ හෝ බඳුන්වල දමා) එසේත් නැත්නම් අනුමත කරන ලද ස්ථානයක(නගරය අවට පිහිටි කොන්ක්‍රීට් බක්කිතුළ) තැබීම. |
| එකතු කිරීම | මූලාශ්‍රවලින් ඉවත් කරන අපද්‍රව්‍ය හලාවත නගර සභාව විසින් එකතු කර අවසන් බැහැර කිරීමේ එක් ස්ථානයක් වෙත ප්‍රවාහනය කිරීම |
| අපහරණය | හලාවත න.ස. විසින් එකතු කරන ලද අපද්‍රව්‍ය අවසන් බැහැර කිරීමේ ස්ථානයකට මුදා හැරීම |
| ප්‍රතිචක්‍රීකරණය | අපද්‍රව්‍යවලින් කොටසක් හෝ සියල්ලම නැවත භාවිතය/ප්‍රතිචක්‍රීකරණය සඳහා පුද්ගලයෙකුට/කඩයකට/කොම්පැණියකට ලබා දීම හෝ විකිණීම. මෙම සංදර්භය තුළදී, ප්‍රතිචක්‍රීකරණය සාමාන්‍යයෙන් යොදා ගන්නේ කාබනික නොවන ද්‍රව්‍ය හා කොම්පෝස්ට් නොකළැකි අපද්‍රව්‍ය, විශේෂයෙන්ම ප්ලාස්ටික්/පොලිතීන්, කඩදාසි[1] වීදුරු, ලෝහ සහ සමහර රෙදි කෑබලි වැනි දෑ ප්‍රතිචක්‍රීකරණය කිරීමයි. ප්‍රතිචක්‍රීකරණය සිදුවීම මූලාශ්‍රයේදී, බැහැර කිරීමේදී නැත්නම් එකතු කිරීමේදීද සිදුවිය හැක. ඊට අමතරව අවසන් බැහැර කිරීම් හා නීති විරෝධී බැහැර කිරීම්වලදීද ප්‍රතිචක්‍රීකරණය සිදු වීමට ඉඩ කඩ තිබේ. |
| කොම්පෝස්ට් සෑදීම | පෝෂණයට හිතකර අපද්‍රව්‍ය (ආහාර, මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය, ගෙවතු අපද්‍රව්‍ය, කඩදාසි) එකතු කර ඔක්සිකරණය කිරීමෙන් වියෝජනයට ලක්කර කිසියම් පාලනයක් ඇතිව වාණිජමය වශයෙන් කොම්පෝස්ට් සෑදීමේ වැඩපිළිවෙලක් හලාවත නගර සභාව, රාජ්‍ය නොවන සංවිධාන හෝ පෞද්ගලික අංශය එක්වී ක්‍රියාත්මක කිරීම. කොම්පෝස්ට්කරණය තුළින් බිම් පිරවුම සඳහා යන අපද්‍රව්‍යවල බර හා පරිමාව අඩුකිරීම, එයින් සිදුවන දූෂණ ශක්තිය අඩු කිරීම, මෙන්ම වෙළෙඳපල ද්‍රව්‍යයක් ලෙස නිපදවා අළෙවි කිරීමේ හැකියාවද ඇති කරයි. |
| නීති විරෝධී බැහැර කිරීම | උත්පාදනය කළ අපද්‍රව්‍යවලින් කොටසක් හෝ සියල්ලම උත්පාදනය කළ පුද්ගලයාගේ නිවසින් බැහැරව, එවැනි ද්‍රව්‍ය දැමීම තහනම් කරන ලද ස්ථානවලට දැමීම (උදා: විවෘත ස්ථානවලට, කානුවලට හෝ ඇළවල් වැනි ස්ථාන) |

[1] බොහොමයක් කඩදාසි කොම්පෝස්ට් සෑදීම සඳහා සුදුසු වන අතර, අනෙක්වා ඉතා සෙමින් දිරාපත්වන හෝ කොම්පෝස්ට් සෑදීමට නුසුදුසු එවා විය හැකිය.(දිළිසෙන පත්‍රවලින් සඟරා ආදිය)

## 2.1.2 අපද්‍රව්‍ය මූලාශ්‍ර

මෙම අධ්‍යයනයේදි, නාගරික අපද්‍රව්‍ය ප්‍රධාන මූලාශ්‍ර ලෙස හඳුනා ගනු ලැබුවේ ගෘහස්ථ, වාණිජ, වෙළෙඳපල,ආයතන, කර්මාන්ත හා අනෙකුත් (පොදු ස්ථාන, මාරග, කාණු හෝ ඇළවල් පිරිසිදු කිරිම) අපද්‍රව්‍ය යන කාණ්ඩ කිහිපයයි. ඒ සෑම එකක්ම පහත සඳහන් ආකාරයට සැකෙවින් විස්තර කර ඇත.

*** 2-2 වගුව අපද්‍රව්‍ය උත්පාදන ප්‍රධාන මූලාශ්‍ර**

| මූලාශ්‍රය | විස්තරය |
|---|---|
| ගෘහස්ථ | ආහාර පිළියෙළ කිරිම, පිරිසිදු කිරිම, ඉන්ධන දැවිම, ගෙම්දුල් ඇමදිම, ගෙවතු ශුද්ධ කිරිම හා අනෙකුත් ගෘහස්ථ ක්‍රියාකාරකම් නිසා එක්වෙන අපද්‍රව්‍ය (පරණ රෙදි, උපකරණ ආදිය) |
| වාණිජ | පොදු වෙළෙඳපලවල් හා කර්මාන්ත හැර ඉතිරි සියළුම වෙළෙඳ , සේවා හා සමහර නිෂ්පාදන ආයතනවලින් එක්වන අපද්‍රව්‍ය |
| වෙළෙඳපල | පොදු වෙළෙඳපලවලින් එක්වන විශාල ප්‍රමාණයේ එළවළු, පළතුරු මස්, මාළු ආදිය(උදා: එළවළු හා පළතුරු වෙළෙඳපොළ) |
| ආයතන | පාසල්, අනෙකුත් අධ්‍යාපන මධ්‍යස්ථාන, රෝහල්, හ.න.ස., රජයේ කාරයාල, පොලිසිය, බන්ධනාගාරය හා ආගමික ස්ථානවලින් එක්වන අපද්‍රව්‍ය. රෝහල්වලින් එක්වන අන්තරායකර අපද්‍රව්‍ය පිළිබඳ වෙනම විස්තර කර ඇත |
| කර්මාන්ත | ඉස්සන්, කුනිස්සන් ගොවිපළවලින් /එම ආහාර මධ්‍යස්ථාන , ලිමෝල් ඇතුළු අනෙකුත් කර්මාන්තවලින් එක්වන අපද්‍රව්‍ය |
| අනෙකුත් | ළමා උද්‍යාන, ක්‍රීඩාංගන හා හ.න.ස. කම්කරුවන් කාණු හා පාර ශුද්ධ කිරිමෙන් එක්වන අපද්‍රව්‍ය |
| ඉදිකිරීම් හා බිඳදැමීම් | ගොඩනැගිළි ඉදිකිරීම්, පුනරුත්ථාපන හා බිඳ දැමීම්වලින් එක්වන අපද්‍රව්‍ය. සාමාන්‍යයෙන් හ.න.ස. විසින් මේවා ඉවත් කිරීමට කටයුතු නොකළද , කොන්ත්‍රාත්කරුවන් මේවා ඉවත් කිරීමට සම්බන්ධ වේ. මෙවැනි ද්‍රව්‍ය පහත් බිම් හෝ වෙනත් බිමක් පිරවිම සඳහා ගතහැකි පිරිසිදු මාධ්‍යයක් ලෙස භාවිතා වුවද, මෙම අධ්‍යයනය තුළ ඒ පිළිබඳව සැළකිල්ලට ලක් නොකෙරේ. |
| අන්තරායකර(විශේෂ) | අන්තරායකර අපද්‍රව්‍ය නිවාස ඇතුළු විවිධ මූලාශ්‍රවලින් බිහි වේ.(බැටරි, දියර විදිනයන්, ආදී). මේවා අදාළ පරිදි එක් එක් කාණ්ඩ යටතේ වෙනම විස්තර කෙරේ.හළාවත නගරය තුළ රෝහල් අන්තරායකර අපද්‍රව්‍ය ලෙස ප්‍රධාන කොට සලකනු ලබන්නේ කතුරු පිහියා වැනි තියුණු උපකරණ, චිකිත්සික උපකරණ, ශරීර කොටස් හා ඉහළ ආසාදිත තත්ත්වයක් ඇති කරන අපද්‍රව්‍ය කළමනාකරණය කිරිමයි. |

## 2.1.3 අපද්‍රව්‍ය උත්පාදනය

### 2.1.3.1 අපද්‍රව්‍ය උත්පාදන ප්‍රමාණය

අපද්‍රව්‍ය උත්පාදන වේගය (පහත සඳහන් වගුව බලන්න) මැණීම හෝ ඇස්තමේන්තු කිරිම කරනු ලැබුවේ ප්‍රමාණාත්මක දත්ත හා සම්මුඛ සමීක්ෂණ මගින් ලබා ගත් දත්ත අනුසාරයෙනි. එයින් දැක්වෙන ප්‍රධාන කරුණු පහතින් සාරාංශ ගත කර ඇත.

- ගෘහස්ථව උත්පාදනයවන අපද්‍රව්‍යවල (ඒකපුද්ගල අපද්‍රව්‍ය උත්පාදනය) සාමාන්‍යය වනුයේ 0.530/කි.ග්/දිනකට/පුද්ගලයෙක් වශයෙනි. මෙය ශ්‍රී ලංකාවේ අනෙකුත් නගර සභාවල දත්තවලට[2] සමාන වේ(0.45-0.65.කි.ග්/දිනකට/පුද්ගලයෙක්).
- වාණිජමය අපද්‍රව්‍ය උත්පාදනය දිනකට/ටොන්/3.67ක් (නාගරික අපද්‍රව්‍යවලින් 16.4%) වන අතර මෙහි උත්පාදන වේගය තරමක් ඉහළ අගයක් ගනී(එක් ව්‍යවසායකයෙක්/දිනකට/8.71/කි.ග්.). මෙම ප්‍රමාණයන් තක්සේරු කරනු ලැබුවේ නගරයේ වාණිජමය අංශය තුළ සුළු හා මහා පරිමාණ

[2] එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (2001) ශ්‍රී ලංකාවේ පරිසර ප්‍රකාශය(2001)
3 දේශීය හෝටල්- කැන්ටීන්, කුඩා හෝටල්

වශයෙන් අපද්‍රව්‍ය උත්පාදන අංශ සඳහා කරන ලද සමීක්ෂණයකින් හා නගර සභා වෙළෙඳ බලපත්‍ර යටතේ කටයුතු කරන ව්‍යාපාරික ස්ථානවලින් ගත් දත්ත අනුසාරයෙනි. ඇත්ත වශයෙන්ම මෙම දත්ත දෙස බැලූ විට පෙනී යන්නේ හළාවත නගරය තුළ පිහිටා ඇති ව්‍යාපාරික ස්ථානවල ක්‍රියාපටිපාටිය නිරීක්ෂණය කර බැලුවහොත් විශේෂයෙන්ම නගරය තුළ පිහිටි විශාල සංඛ්‍යාවක භෝජනශාලා, දේශීය හෝටල[3], බේකරි, දැව හා වඩු වැඩ කරන ස්ථාන, හා ලෝහ භාණ්ඩවලට අදාළ ව්‍යාපාරික ස්ථානවලින් ඉහළ අගයකින් යුත් අපද්‍රව්‍ය ප්‍රමාණයක් බැහැර කරන බවයි.

- පොදු වෙළෙඳපලවලින් උත්පාදනය වන අපද්‍රව්‍ය (දිනකට/ටොන්/0.84, නාගරික කසළවලින් 3.8%) ප්‍රමාණය පදනම් වන්නේ හ.න.ස. තුළ පිහිටි මාළු හා එළවළු වෙළෙඳපලවලින් බැහැර වන ප්‍රමාණය අනුවයි. එ අනුව එක් වෙළෙඳ කුටියකින් දිනකට/කි.ග්/1.55 ප්‍රමාණයක් බැහැර කෙරේ. මාළු වෙළෙඳපලේ මුළු එකතුව සඳහා මෙම කුටිවලින් එක්වන ප්‍රමාණයට අමතරව, කුඩා 150කින් පමණ සිදුවන සිල්ලර වෙළෙඳාමද ඇතුළත් කර ඇති නමුත් උත්පාදන ප්‍රමාණය සාමාන්‍යයෙන් ඉතා පහළ මට්ටමක පවතින බැවින් මෙය තරමක් සාධාරණ අගයන් බව කිව හැකිය.

- දිනපතා එක්වන පොලිෂ් ටින්, බැටරි, ප්‍රතිදීප්ත බල්බ්, රේසර, බ්ලේඩ්(සැලූන්වලින්), පරණ බෙහෙත් ද්‍රව්‍ය(ෆාමසිවලින්) ආදි, අන්තරායකර අපද්‍රව්‍ය උත්පාදනය තරමක් පහළ මට්ටමක පවතින අතර, ඒවා බැහැර කරනු ලබන්නේ සාමාන්‍ය අපද්‍රව්‍ය සමග එකට මිශ්‍රවය. කෙසේ වෙතත් හළාවත නගරයේ පිහිටි බෝට්ටු සෑදීමේ කර්මාන්තශාලා දෙකක් ඇති අතර එයින් නිපදවෙන ෆයිබර්ග්ලාස් අපද්‍රව්‍ය ප්‍රමාණය තරමක් සැළකිය යුතු මට්ටමක ඇත.

- හළාවත මූලික රෝහලින් සැළකිය යුතු ප්‍රමාණයක අන්තරායකර අපද්‍රව්‍ය නිපදවෙන අතර අනෙකුත් රෝහල් දෙකෙන් එක්වෙන්නේ ඉතා සුළු ප්‍රමාණයකි.සෞඛ්‍යාරක්ෂිත අපද්‍රව්‍ය ලෙස එක්වන මුළු ප්‍රමාණය, චිකිත්සික හා ශරීර කොටස්- මසකට ටොන් 0.96/, කළල බන්ධ -මසකට ටොන් 0.44ක් / පිහියා ආදී තියුණු උපකරණ- මසකට ටොන් 0.26 ක් හා ඉහළ ආසාදනයක් ඇති කරන ද්‍රව්‍ය -මසකට ටොන් 0.034 ලෙස දළ වශයෙන් ගණන් බලා තිබේ.

- නාගරික අපද්‍රව්‍ය උත්පාදනයේ මුළු ප්‍රමාණය දිනකට ටොන් 22.0 වන අතර එක පුද්ගල අපද්‍රව්‍ය උත්පාදනය දිනකට කි.ග්. 0.90කි. එක් එක් මූලාශ්‍රවලින් උත්පාදනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය රූප සටහන් අංක 2-1 දක්වා ඇත.

* 2-3 වගුව ඇස්තමේන්තු කරන ලද අපද්‍රව්‍ය උත්පාදන ප්‍රමාණයන්(2002)

| මූලාශ්‍රය | අපද්‍රව්‍ය උත්පාදන දත්ත | | | අපද්‍රව්‍ය උත්පාදනය | | |
|---|---|---|---|---|---|---|
| | ඒකක ප්‍රමාණය | උත්පාදන ඒකක ප්‍රමාණය | ඒකක ගණන | ප්‍රමාණය (දිනකට/ටොන්) | | % |
| නේවාසික | 0.530 | පුද්ගලයෙක් දිනකට/කි.ග | 24,539 | 13.00 | 13.00 | 59.2 |
| වාණිජ | 8.71 | ව්‍යාපාරයක්/දිනකට/කි.ග | 413 | 3.60 | 3.60 | 16.4 |
| වෙළෙඳපල | 1.55 | කුටියක්/දිනකට/කි.ග | 541 | 0.84 | 0.84 | 3.8 |
| ආයතන:<br>පාසල්<br>වෙනත් අධ්‍යාපන ආයතන<br>රෝහල්<br>රජයේ කාර්යාල<br>ආගමික ස්ථාන | <br>0.093<br><br>0.056<br>0.339<br>0.807<br>1.01 | <br>සිසු+ගුරුවරු/දිනකට/කි.ග.<br><br>-එම-<br>රෝගීන්+කාර්යමණ්ඩලය/දිනකට/කි.ග<br>වැඩකරන්නෙක්/දිනකට/කි.ග<br>පූජකවරයෙක්/දිනකට/කි.ග | <br>11,556<br><br>2,107<br>2,321<br>898<br>45 | <br>1.07<br><br>0.12<br>0.79<br>0.72<br>0.05 | 2.75 | 12.5 |
| කර්මාන්ත:<br>ඉස්සන් වගා<br>ලීමෝල්<br>වෙනත්(6) | <br>16<br>34.7<br>0.20 | <br>ගොවිපළක්/දිනකට/කි.ග<br>වැඩකරන්නෙකු/දිනකට/කි.ග<br>දිනකට/ටොන් | <br>14<br>19<br>- | <br>0.22<br>0.66<br>0.20 | 1.08 | 4.9 |
| වෙනත්:<br>උද්‍යාන<br>පාර/කාණු පිරිසිදු කිරීම් | <br>0.30<br>0.40 | <br>දිනකට/ටොන්<br>දිනකට /ටොන් | | <br>0.30<br>0.40 | 0.70 | 3.2 |
| මුළු එකතුව | 0.90 | පුද්ගලයෙක්/දිනකට/කි.ග. | 24,539 | 21.97 | 21.97 | 100.0 |

සටහන: ඒකක ප්‍රමාණය යනු අපද්‍රව්‍ය උත්පාදනය කිරීමේ ප්‍රමාණයයි.




** 2-1 රූප සටහන: **ගළාවත නගර සීමාව තුළ විවිධ මූලාශ්‍රයන් මගින් සිදු වන අපද්‍රව්‍ය උත්පාදනය (2002)**

2.1.3.2 අපද්‍රව්‍ය උත්පාදනයට බලපාන කරුණු

ගළාවත නගරයේ අපද්‍රව්‍ය උත්පාදනයට බලපාන ප්‍රධාන කරුණු පහතින් සඳහන් කර තිබේ.

- උත්සව සමයේදී (මුන්නේශ්වරම හා තෙපොන්ගල්) හා වෙනත් විශේෂිත අවස්ථාවලදී(පොළ හා පාසල් ක්‍රීඩා උත්සව) වාණිජ මධ්‍යස්ථානවලින්,වෙළෙඳපළ හා ආයතනවලින් බැහැර කරන අපද්‍රව්‍ය ප්‍රමාණය සාමාන්‍යයෙන් 1-3 ගුණයක් දක්වා වැඩි වේ.

- ඍතුමය වෙනස්කම් අනුවද, උත්පාදනය වන අපද්‍රව්‍ය ප්‍රමාණයේ වැඩිවීමක් දක්නට ඇත. තෙත් ඍතුවේදී (මැයි-ජුනි - සුළු, හා ඔක්තෝබර, නොවැම්බර හා දෙසැම්බර- මහා) ගෙවතු අපද්‍රව්‍ය වැඩිවීම නිසා එකතුවන මුළු අපද්‍රව්‍ය ප්‍රමාණයද වැඩි වේ.

## 2.1.4 අපද්‍රව්‍ය ප්‍රවාහය බෙදී යන අයුරු

### 2.1.4.1 ක්ෂේත්‍ර පරීක්ෂණ ප්‍රතිඵල

ස්ථානීය-බැහැර කිරීම, එකතු කිරීම පිණිස බැහැර කිරීම, බැහැර කරන (අපහරණ) භූමිය වෙත සෘජුවම ප්‍රවාහනය කිරීම, ස්ථානීය කොම්පෝස්ට්කරණය සහ මූලාශ්‍රයේදීම හෝ නීති විරෝධි බැහැර කිරීම්වලින් සිදුකරන ප්‍රතිචක්‍රීකරණය යනාදිය පහත වගුවෙන් පෙන්වා දී ඇත.

* 2-4 වගුව: අපද්‍රව්‍ය ප්‍රවාහයේ ක්ෂේත්‍ර පරීක්ෂණ ප්‍රතිඵල (2002)

| මූලාශ්‍රය | ක්‍රමය (%) | විස්තරය |
|---|---|---|
| ගෘහස්ථ | බැ.කි: 45.3%<br>නී.වි.බැ.කි. 31.5%<br>ස්.බැ.කි.:22.0%<br>ප්‍රතිචක්‍රීකරණය: 1.3% | මහජන මත විමසීමේ පවුල් සමීක්ෂණ ප්‍රතිඵල මගින් 80% ක් ලෙස වූ ඇස්තමේන්තුගත නගර සභා සේවාව ආවරණ ප්‍රතිශතය තරමක වෙනස්වීමකට භාජනය විය.(ජනගහණයෙන්) |
| වාණිජ | බැ.කි: 71.1% | බොහොමයක් වාණිජ අපද්‍රව්‍ය හ.න.ස. මගින් එකතු කිරීම පිණිස ඉවතලනු ලැබේ. |
| | ස්.බැ.කි.: 25.4% | වාණිජ ස්ථාන සමහරක් ඔවුන්ගේ අපද්‍රව්‍ය බොහොමයක් (ප්‍රධාන වශයෙන් කඩදාසි) පුළුස්සා දමනු ලබයි. |
| | ප්‍රතිචක්‍රීකරණය: 3.4% | ප්‍රතිචක්‍රීකරණය සීමාසහිතය. ප්‍රධාන වශයෙන් භෝජනශාලා කිහිපයක් හා හළාවත තානායමේ ආහාර හා මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය සත්ත්වාහාර සඳහා භාවිතා කරන අතර, ඇතැම් කඩදාසි හා කාඩ්බෝඩ්, වීදුරු,ප්ලාස්ටික් හා ලෝහ වර්ග ප්‍රතිචක්‍රීකරණය කරනු ලැබේ. |
| | කොම්පෝස්ට් 0.1% | මුළුතැන්ගෙයි සමහර අපද්‍රව්‍යවලින් ලංකා බැංකුව තම ප්‍රයෝජනය සඳහා කොම්පෝස්ට් නිෂ්පාදනය කරයි. |
| වෙළෙඳපල | බැ.කි.: 96.3 | වෙළඳපල අපද්‍රව්‍ය සියල්ලම පාහේ හළාවත න.ස.විසින් එකතු කරනු ලැබේ. |
| | ප්‍රතිචක්‍රීකරණය: 3.7 | ඉතා සුළු ප්‍රතිචක්‍රීකරණයකි.විශේෂයෙන් කාබනික ද්‍රව්‍ය (සත්ත්වාහාර ලෙසද,) තැඹිලි කෝම්බ, සමහර සත්ත්ව කොටස්,කඩදාසි හා කාඩ්බෝඩ් යනාදියද ප්‍රතිචක්‍රීකරණය සඳහා ගැනේ. |
| පාසල් | බැ.කි.: 44.6 | සමීක්ෂණය කරන ලද පාසල් 6න් 4ක් (හ.න.ස. ජනගහණයෙන් 75%) තම කසළවලින් කොටසක්(පාසල් 2ක්) හා සියළුම කසළ(පාසල් 2) නගර සභා එකතු කිරීමට ලබා දේ, |
| | ස්.බැ.කි.: 32.7 | පාසල් 6න් 4ක් තම කසළවලින් කොටසක් (පාසල් 3ක්) පුළුස්සන අතර, එක් පාසලක් එහි සියළුම අපද්‍රව්‍ය ස්ථානීය බැහැර කිරීමට ලක් කරයි. |
| | නී. වි.බැ. කි.:22.7 | ආනන්ද විද්‍යාලය එහි සියළුම අපද්‍රව්‍ය අසළ පිහිටි සුසාන භූමියකට විවෘතව බැහැර කරයි. |
| වෙනත් අධ්‍යාපන ආයතන | ස්.බැ.කි.: 55.2<br>බැ.කි. 35%<br>නී.වි.බැ. කි. 9.8% | පාසල් සමීක්ෂණ මගින් ඇස්තමේන්තු කරන ලද දත්ත ප්‍රමාණයන් හා ප්‍රදේශය පිළිබඳ වූ අවබෝධය තරමක් සීමාසහිත විය. විද්‍යාකර වියුෂන් පන්තියේ එක්වන සියළුම අපද්‍රව්‍ය එම ස්ථානයේම පුළුස්සා දමයි. |

| | | |
|---|---|---|
| රෝහල් | බැ.කි.: 91.1% | හලාවත මූලික රෝහලේ සහ කුඩා පෞද්ගලික රෝහල් දෙකකින් (හලාවත ක්ලිනික්, ශාන්ත මේරි සාත්තු නිවාසය) බැහැරවන සාමාන්‍ය අපද්‍රව්‍ය සියල්ලම පාහේ හ.න.ස. විසින් එකතු කරනු ලැබේ. (අන්තරායකර සෞඛ්‍යාරක්ෂක අපද්‍රව්‍ය සඳහා පහතින් ඇති විස්තරය බලන්න). |
| | ස්.බැ.කි. 7.1% | මූලික රෝහල එහි සෞඛ්‍යාරක්ෂක අන්තරායකර අපද්‍රව්‍ය එම ස්ථානයේම වළ දැමීම හෝ පුළුස්සා දැමීම සිදු කරයි. කුඩා පෞද්ගලික රෝහල් දෙකේ එවැනි අපද්‍රව්‍යවලින් සුළු කොටසක් එම ස්ථානයේම බැහැර කිරීම හෝ හ.න.ස. එකතු කිරීම සඳහා බැහැර කරන බවට සිතිය හැක. |
| | ප්‍රතිචක්‍රීකරණය 1.8% | හලාවත මූලික රෝහලේ හා ක්ලිනික් (පෞද්) රෝහලේ ප්ලාස්ටික්,/වීදුරු බෝතල්/ බඳුන් හා පොල්කටු ආදිය ප්‍රතිචක්‍රීකරණයට ලක් වේ. |
| රජයේ කාර්යාල | බැ.කි.: 75.1% | සමීක්ෂණය කළ කාර්යාල 3න් 2ක් ඔවුන්ගේ අපද්‍රව්‍යවලින් කොටසක් සඳහා නගර සභාවේ කසළ එකතු කිරීමේ සේවය භාවිතා කරයි. හ.න.ස. ලබා ගත් අමතර දත්ත අනුව පෙනී යන්නේ පොලිසියේ හා බන්ධනාගාරයේ සියළුම අපද්‍රව්‍ය නගර සභා සේවය මගින් එකතු කරන බවයි. |
| | ස්. බැ. කි.: 24.8% | සමීක්ෂණය කළ කාර්යාල 3න් 2ක් ඔවුන්ගේ අපද්‍රව්‍යවලින් කොටසක් හා එක් කාර්යාලයක් එහි සියළුම අපද්‍රව්‍ය වළ දැමීම හෝ පුළුස්සා දැමීම සිදු කරයි. |
| | ප්‍රතිචක්‍රීකරණය: 0.1% | එක් කාර්යාලයක් එහි එක්වන කඩදාසිවලින් කොටසක් ප්‍රතිචක්‍රීකරණය කරයි. |
| ආගමික ස්ථාන | බැ.කි.: 80% | සමීක්ෂණය කර නැත. නුවර හා මාතලේ කරන ලද සමීක්ෂණ දත්ත මත සකසා තිබේ. |
| | ස්. බැ. කි. : 20.0% | |
| ඉස්සන් කුනිස්සන් ගොවිපළවල්/ බීජ මධ්‍යස්ථාන | ස්. බැ. කි. 88.4% | ප්‍රීමා කුනිස්සන් ගොවිපල මසකට කඩදාසි බෑග් 700ක් පමණ හා ලෝහ බැරල්වලින් කොටසක් ප්‍රතිචක්‍රීකරණය කරන අතර ඉතිරි සියල්ලම එම ස්ථානයේම පුළුස්සා දමනු ලබයි. |
| | ප්‍රතිචක්‍රීකරණය 7.8% | ෆරනිමෙල් ඇක්වා ව්‍යාපෘතියේ අපද්‍රව්‍යවලින් බොහොමයක් එම ස්ථානයෙන් බැහැරව කිසියම් ස්ථානයකට අපහරණය කරන අතර එය නීති විරෝධී බැහැර කිරීමක් ලෙස සළකනු ලැබේ. |
| | නී.වි. බැ. කි. 3.8% | |
| ලී මෝල් හා දැව ගබඩා | ප්‍රතිචක්‍රීකරණය: 73.3% | සමීක්ෂණය කරන ලද ලී මෝල් 5ක 4කින් එක් ලී මෝලක් අපද්‍රව්‍ය(ලී කුඩු) බොහොමයක් හා අනෙක් 3 අපද්‍රව්‍ය සියල්ලම විකිණීම හෝ පිටට දීම සිදු කරයි. ස්ථාන දෙකක එක්වන ලී කුඩුවලින් කොටසක් පුළුස්සා දමන අතර දෙකක් එහි එක්වන ලී පතුරුවලින් කොටසක් විකිණීම හා ස්ථානීයව බැහැර කරන අතර එකක් එහි සියළුම ලී පතුරු විකුණනු ලබයි. |
| | ස්. බැ. කි 26.7% | |
| වෙනත් කර්මාන්ත | බැ. කි.: 74.8% | සමීක්ෂණය කරන ලද කර්මාන්ත 4න් 3ක්ම(නීල මැරීන් බෝට්ටු අංගනයේ ෆයිබර්ග්ලාස් අපද්‍රව්‍ය ඇතුළුව) නගර සභා සේවයේ එකතු කිරීම සඳහා තම අපද්‍රව්‍ය වලින් කොටසක් බැහැර කරයි. බාටා කොම්පැණියේ අපද්‍රව්‍යයද නගර සභා සේවය මගින් එක්රැස් කරයි. |
| | ස්. බැ. කි.: 20.1% | ස්ථාන දෙකක අපද්‍රව්‍යවලින් කොටසක් වළ දැමීම හෝ පුළුස්සා දමයි. |
| | නී.වි. බැ. කි. 5.0% | ජස්ටින් කුරේ බෝට්ටු නිෂ්පාදකයෝ ෆයිබර්ග්ලාස් ඇතුළු සියළු අපද්‍රව්‍ය නීති විරෝධී ආකාරයට බැහැර කරයි. |
| උද්‍යාන | බැ. කි.: 100% | ළමා උද්‍යාන ඇතුළු සියළුම ක්‍රීඩාංගනවල අපද්‍රව්‍ය හ.න.ස. සේවය මගින් එක් කරන බවට අනුමාන කළ හැකිය. |
| පාර හා කාණු සුද්ධ කිරීම | බැ. කි : 100% | මෙයින් එක්වන සියළුම අපද්‍රව්‍ය හ.න.ස. සේවය මගින් එක් කරන බවට අනුමාන කළ හැකිය. |

**සටහන**: ස්.බැ.කි. –ස්ථානීය බැහැර කිරීම/ නී.වි. නීතිවිරෝධී බැහැර කිරීම

බැ.කි.– නගර සභා සේවය සඳහා බැහැර කිරීම

*වෙනත් කර්මාන්තවල අපද්‍රව්‍යවලින් සමහරක් (සුළු ප්‍රමාණයක්) ප්‍රතිචක්‍රීකරණයට යොදා ගැනේ.මසකට කි.ග්‍රෑ. 150ක පමණ රෙදි(මිඩ් ගාමන්ට් ෆැක්ටරිය), හා ලෝහ බැරල් කිහිපයක්

### 2.1.4.2 අපද්‍රව්‍ය ප්‍රවාහයේ වෙනත් ස්ථානවලදී සිදුවන කොම්පෝස්ට්කරණය හා ප්‍රතිචක්‍රීකරණය

මූලාශ්‍රය තුළදී සිදුවන ප්‍රතිචක්‍රීකරණයට අමතරව අපද්‍රව්‍ය ප්‍රවාහයේ වෙනත් ස්ථානවලදී කොම්පෝස්ට් ක්‍රියාවලිය සිදුවිය හැකි බවට සිතිමට පුළුවන. එවැනි ස්ථානවලදී සිදුවෙන කොම්පෝස්ට් හා ප්‍රතිචක්‍රීකරණ ප්‍රමාණයන් පිළිබඳ විස්තර පහතින් සඳහන් කර ඇත.

- **බැහැර කිරීමෙන් අනතුරුව** : පුද්ගලික එකතු කරන්නන්(කසළ ඇහිදින්නන්) විසින් නගර සභාවෙන් කසළ එකතු කිරීමට ප්‍රථම බැහැර කර ඇති අපද්‍රව්‍ය ගොඩවලින් ඔවුනට වටිනාකමක් ඇති ප්‍රතිචක්‍රීකරණය කළ හැකි හා නැවත භාවිතා කළ හැකි ද්‍රව්‍ය එකතු කරනු ලැබේ. නිවෙස්වලට හා අනෙකුත් ස්ථානවලට සෘජුවම ගොස් (සමීක්ෂණය කළ පවුල්වලින් 43%ට) මෙවැනි ද්‍රව්‍ය එක්රැස් කරන පුද්ගලයින් සංඛ්‍යාව ඉතා ඉහළ බැවින් හා අපද්‍රව්‍ය කළහැකි ද්‍රව්‍ය නිවෙස් හිමියන් විසින්ම කඩවලට රැගෙන යාම(සමීක්ෂණය කළ පවුල්වලින් 23%) නිසාත් ඉතා ටික දෙනෙකු පමණක් ඉහතින් සඳහන් කළ ආකාරයේ අපද්‍රව්‍ය එකතු කිරීම්වල නියැලෙන නිසා එමගින් එක්වන අපද්‍රව්‍ය ප්‍රමාණය නොසැළකිය යුතු තරම් වේ.

- **එකතු කරන අතරතුරදී** : හළාවත නගර සභා කම්කරුවන්ගෙන් 17%ක් එකතු කරන ලද අපද්‍රව්‍ය වලින්, විකිණීම සඳහා බෝතල් සහ ලෝහ බේරා වෙන්කර ගැනීම සිදු කරන බව ඇස්තමේන්තු කර ඇත. හළාවත නගර සභා කම්කරුවන් 41%ක් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා සමීක්ෂණවලට අනුව, දිනකට 25kg ක පමණ ද්‍රව්‍යයන් මෙලෙස නැවත ලබා ගන්නා බවට විශ්වාස කෙරේ.

- **අවසාන බැහැර කිරීමේ භූමියේදී** : හළාවත නගර සභා කම්කරුවන්ගෙන් කිසිවෙක්, කිසිම අවසාන බැහැර කිරීමේ භූමියක් සඳහා පත්කර නොමැති අතර එබැවින් මෙම ස්ථානවලදී ප්‍රතිචක්‍රීකරණය සඳහා ඔවුන් දායක වී නොමැත. හළාවත නගර සභාවේ බැහැර කිරීමේ භූමි 5 අසළ ජීවත්වන පවුල් 50ක් සඳහා කළ සමීක්ෂණයට අනුව, ඔවුන්ගෙන් කිසිවෙක් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය හෝ සත්ත්ව ආහාර සඳහා ආහාර/මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය මෙම භූමිවලින් එකතු කරනු නොලැබේ. කෙසේ නමුත්, මෙයින් පවුල් දෙකක් ඔවුන් ඇති කරන සතුන් සමහරකට බැහැර කිරීමේ භූමි දෙකකදී දිනපතාම තණ කෑවීම සඳහා ඉඩහරිනු ලැබේ (අළුත්වත්ත සහ සුදුවැල්ල). පිටතින් පැමිණෙන කිසිදු කසළ අහුලන්නෙක් හළාවත නගර සභා බැහැර කිරීමේ භූමියක් තුළදී හඳුනා ගැනීමට මෙම අධ්‍යයන කාලය තුළදී නොහැකි විය. එබැවින්, අවසාන බැහැර කිරීමේ භූමියේ දී සිදුවන ප්‍රතිචක්‍රීකරණය නොසළකා හැරිය හැකි යැයි සළකනු ලැබේ.

- **නීත්‍යානුකූල නොවන බැහැර කිරීම් භූමිවලදී** : නීත්‍යානුකූල නොවන ආකාරයෙන් බැහැර කරන භූමිවල දී සිදුවන ප්‍රතිචක්‍රීකරණය ද නොසළකා හැරිය හැකි තරම් වේ.

- **ORDE කොම්පෝස්ට් කර්මාන්තය** : හළාවත නගර සභා සහ ORDE ආයතනයේ සටහන්වලට අනුව, එළවළු හා මාළු වෙළඳපල අපද්‍රව්‍යවලින් දිනකට ටොන් 0.81 ක පමණ ප්‍රමාණයක් හළාවත නගර සභාව මගින් කොම්පෝස්ට් සෑදීම සඳහා ORDE කොම්පෝස්ට් කර්මාන්තය වෙත ගෙන යනු ලැබේ.

මූලාශ්‍රයේදී හැර අනෙක් ස්ථානවල දී ප්‍රතිචක්‍රීකරණය කරනු ලබන මුළු ප්‍රමාණය හෝ කොම්පෝස්ට්කරණය සඳහා යවන ප්‍රමාණය පිළිවෙලින් දිනකට 25kg ක් සහ දිනකට ටොන් 0.81 ක් වන අතර, මෙය මුළු අපද්‍රව්‍ය උත්පාදනයෙන් 0.1% කට සහ 3.7% කට සමාන වේ.

ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ඇතැම් ද්‍රව්‍ය, පුද්ගලික එකතු කරන්නන් සහ හලාවත නගර සභා කම්කරුවන් විසින් කෙළින්ම අතරමැදි වෙළඳුන් වෙත ගෙනයනු ලැබේ. අතරමැදි වෙළෙඳුන් පස් දෙනෙක් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවලට අනුව, හලාවත නගර සීමාව තුළින් මෙම ආකාරයට නැවත ලබා ගනු ලබන මුළු ද්‍රව්‍ය ප්‍රමාණය දිනකට ටොන් 0.35 ක් වන බවට ඇස්තමේන්තු කර ඇත. මූලාශ්‍රයේ දී සිදුවන ප්‍රතිචක්‍රීකරණය කිරීමේ මුළු එකතුව සඳහා මෙම අගය අන්තර්ගත කර ඇත (ශ්‍රී මෝල් අපද්‍රව්‍යවලින් සිදුවන ප්‍රතිචක්‍රීකරණය-දිනකට ටොන් 0.48 අතහැර දිනකට ටොන් 0.34කි).

*** 2-5 වගුව : ප්‍රතිචක්‍රීකරණ දත්ත සාරාංශය**

| ද්‍රව්‍යය | පවුල් ගණන (නිවාස 120ක සමීක්ෂණයෙන්) | | ප්‍රතිචක්‍රීකරණය කරනු ලබන ප්‍රමාණ (kg/d) | |
|---|---|---|---|---|
| | පුද්ගලික එකතුකරන්නන්ට දෙන | වෙළඳසැල් වෙත ගෙනයන | එකතු කරන අතරතුරදී | අතරමැදියන් විසින් එකතු කිරීමෙන් |
| කඩදාසි/කාඩ්බෝඩ් | 18 | 5 | 0 | 22.4 |
| ප්ලාස්ටික් | 0 | 0 | 0 | 12.4 |
| වීදුරු | 47 | 23 | 22.8 | 59.6 |
| ලෝහ | 11 | 0 | 2.5 | 198.7 |
| බැටරි ඇසුරුම් | 0 | 0 | 0 | 58.0 |
| එකතුව | 52 | 28 | 25.3 | 351.2 |

**සටහන්:**

1. පුද්ගලික එකතු කරන්නන් නිවෙස් 87කට යන නමුත්, සැබවින්ම මෙම එකතු කරන්නන්ට ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය දෙනු ලබන්නේ නිවාස 52 න් පමණකි.
2. බොහෝ දුරට එකතු කරන ප්‍රධාන ලෝහ වර්ගය යකඩ වන අතර අනතුරුව ඇලුමිනියම් වේ. තඹ සහ පිත්තලද තරමක් එකතු කරනු ලැබේ.

### 2.1.4.3 එකතු කරන සහ බැහැර කරන ප්‍රමාණයන්

වර්තමානයේ දී එකතු කරනු ලබන ප්‍රමාණ නිර්ණය කර ඇත්තේ, 2002 අගෝ. 12-18 දක්වා වූ දින 7ක කාලයක් පුරා සෑම කළාපයක් තුළම කසළ එකතු කරන ලද වාහන වාර ගණන පිළිබඳ වූ හලාවත නගර සභා සටහන් ආශ්‍රයෙනි. JICA ආයතනය මගින් කසළ පිරවූ වාහන වාර ගණන් කිරීමේ සමීක්ෂණය හලාවත නගරයේදී සිදු නොකළ අතර, හලාවත නගර සභාව මගින් භාවිතා කරනු ලබන බැහැර කිරීමේ බිම් විශාල සංඛ්‍යාවක් නිරීක්ෂණය කිරීම ආශ්‍රිත වූ න්‍යායික අපහසුතාවය මේ සඳහා හේතු වී ඇත. පහත වගුවෙහි දක්වා ඇති ආකාරයට, ඝ.න.ස. දත්ත ටොන් බවට පරිවර්තනය කර ඇති අතර ඒ සඳහා අත්කරත්ත, ට්‍රැක්ටර හා ලොරිවල මනින ලද වාහන ධාරිතාවයන් ($m^3$), හා JICA කේෂත්‍ර නිරීක්ෂණ හා නගර සභාවේ අත්දැකීම් මත පදනම් වූ පිරවුම් සාධක සහ සුදුසු ඝණත්ව දත්ත යන කරුණු උපයෝගී කර ගෙන ඇත.

* 2-6 වගුව : හළාවත නගර සභාවේ ඝ.අ.ක. වාහන පරිමා සහ පැටවිය හැකි ප්‍රමාණ පිළිබඳ දත්ත

| වාහනය | පරිමාව ($m^3$) | ඝණත්වය ($kg/m^3$) | පිරවුම් සාධකය (z) | පැටවිය හැකි ප්‍රමාණය (T) |
|---|---|---|---|---|
| අත්කරත්ත(5) | 0.42 | 300 | 95 | 0.12 |
| අත්ට්‍රැක්ටර(2) | 2.6-3.2 (සාමාන්‍යය=2.9) | 246 | 80 | 0.52-0.63 (සාමාන්‍ය=0.57) |
| ට්‍රැක්ටර ට්‍රේලර(4) | 6.7-8.1 (සාමාන්‍යය=7.3) | 246 | 60 | 0.99-1.19 (සාමාන්‍යය=1.08) |
| ලොරි(1) | 3.0 | 246 | 110 | 0.81 |

**සටහන:**

1. සැබෑ වාහන පරිමාණයන් ආධාරක වාර්තාවෙහි සඳහන් කර ඇත.
2. හ.න.ස.වේ සමහර අත්කරත්ත මගින් වෙනත් වාහනයකට අපද්‍රව්‍ය මාරු කරනු වෙනුවට කෙළින්ම බැහැර කිරීම සඳහා මුදාහරින බැවින්, නගර සභාවෙන් එකතු කරන ප්‍රමාණ ඇස්තමේන්තු කිරීමේ දී අත්කරත්ත මගින් ගෙන යනු ලබන මෙම කසළ ප්‍රමාණයද ඇතුළත් කර ඇත.
3. ඝණත්ව දත්ත: හ.න.ස එකතු කිරීමේ වාහන සඳහා[4] WACS සමීක්ෂණ දත්ත අනුව අත්කරත්ත සඳහා (200$kg/m^3$) ද, හ.න.ස ට්‍රේලර සහ ලොරි සඳහා පිළිවෙළින් 300$kg/m^3$ ක් සහ 246$kg/m^3$ ක් වේ.
   2002 ජූලි-අගෝ. වලදී, කොළඹ වාහන කිරණ උපකරණය (weighbridge) මගින් මනින ලද අගයන්ට හා මාතලේ සහ මහනුවර මහ නගර සභාවලින් ලබා ගත් සංසන්දනාත්මක දත්තවලට අනුව ලොකු ට්‍රැක්ටර ට්‍රේලරයක් (6.3$m^3$) සඳහා වූ ස්ථානීය අපද්‍රව්‍ය ඝණත්වය- 390$kg/m^3$.

වර්තමානයේ හ.න.ස. මගින් දිනකට බැහැර කරනු ලබන ටොන් 11.1 වූ අපද්‍රව්‍ය ප්‍රමාණය, එකතු කරන ප්‍රමාණයට වඩා අඩුය. මේ සඳහා මූලිකව හේතු වී ඇත්තේ දිනකට ටොන් 0.81 ක එළවළු හා මාළු වෙළඳපල අපද්‍රව්‍ය, කොම්පෝස්ට් සෑදීම සඳහා ORDE වෙත යවනු ලැබීම හ.න.ස. සේවකයන් විසින් ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය ඉතා කුඩා ප්‍රමාණයක් (දිනකට කි.ග්‍රෑ. 25ක්) කසළ මුදාහැරීම සහ බැහැර කිරීම අතරතුර දී එකතු කරන නිසාවෙනි.

## 2.1.5 අපද්‍රව්‍ය ප්‍රවාහය

හළාවත නගරයේ අපද්‍රව්‍ය ප්‍රවාහ දත්ත පහතින් සටහන් කර ඇත.

* 2-7 වගුව : අපද්‍රව්‍ය ප්‍රවාහය බෙදා දැක්වීම (2002)

| මූලාශ්‍රය | ස්ථානීය බැහැර කිරීම | ස්ථානීය කොම්පෝස්ට් කරණය | බැහැර කිරීම | ප්‍රතිචක්‍රී කරණය | නීතිවිරෝධී ලෙස බැහැර කිරීම | ORDE කොම්පෝස්ට් ව්‍යාපෘතිය | උත්පාදනය |
|---|---|---|---|---|---|---|---|
| ගෘහාශ්‍රිත | 2.86 | 0.00 | 5.89 | 0.16 | 4.09 | 0.00 | 13.00 |
| වාණිජ | 0.91 | 0.00 | 2.56 | 0.12 | 0.00 | 0.00 | 3.60 |
| වෙළඳපල | 0.00 | 0.00 | 0.81 | 0.03 | 0.00 | 0.00 | 0.84 |
| ආයතන: | | | | | | | |
| • පාසල් | 0.35 | 0.00 | 0.48 | 0.00 | 0.24 | 0.00 | 1.07 |
| • වෙනත් අධ්‍යාපන. | 0.07 | 0.00 | 0.04 | 0.00 | 0.01 | 0.00 | 0.12 |
| • ආරෝග්‍යශාලා | 0.06 | 0.00 | 0.72 | 0.01 | 0.00 | 0.00 | 0.79 |
| • රජයේ කාර්යාල | 0.18 | 0.00 | 0.54 | 0.00 | 0.00 | 0.00 | 0.72 |
| • ආගමික | 0.01 | 0.00 | 0.04 | 0.00 | 0.00 | 0.00 | 0.05 |
| කර්මාන්ත: | | | | | | | |
| • ඉස්සන් ගොවිපල | 0.20 | 0.00 | 0.00 | 0.02 | 0.01 | 0.00 | 0.22 |

[4] JICA සමීක්ෂණ ප්‍රතිඵල මගින් දින හතරක කාලයක් තිස්සේ කසළ එකතු කරන විවිධ වාහනවලින් ගෙදිනකව ලබා ගන්නා ලද කසළ සාම්පල මිශ්‍රණයක සාමාන්‍ය ඝණත්වය පෙන්වනු ලබයි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| • ලී මෝල්<br>• වෙනත් | 0.18<br>0.04 | 0.00<br>0.00 | 0.00<br>0.15 | 0.48<br>0.00 | 0.00<br>0.01 | 0.00<br>0.00 | 0.66<br>0.20 |
| වෙනත්:<br>• උද්‍යාන<br>• මාර්ග/කාණු | 0.00<br>0.00 | 0.00<br>0.00 | 0.30<br>0.40 | 0.00<br>0.00 | 0.00<br>0.00 | 0.00<br>0.00 | 0.30<br>0.40 |
| උප එකතුව | 4.85 | 0.00 | 11.92 | 0.83 | 4.36 | 0.00 | 21.97 |
| **ප්‍රතිචක්‍රීකරණය;** | **එකතු කිරීම සහ බැහැර කිරීම** | | | | | | |
| -ඉවතලීමේ දී | | | -0.00 | +0.00 | | | |
| -එකතු කිරීමේ දී | | | -0.03 | +0.03 | | | |
| -බැහැර කරන භූමියේ දී | | | -0.00 | +0.00 | -0.00 | | |
| ORDE වෙතට | | | -0.81 | | | +0.81 | |
| එකතුව | 4.85 | 0.00 | 11.09 | 0.86 | 4.36 | 0.81 | 21.97 |
| % | 22.1 | 0.0 | 50.5 | 3.9 | 19.9 | 3.7 | 100.0 |

අපද්‍රව්‍ය ප්‍රවාහය මගින් පහත සඳහන් කරුණු පෙන්නුම් කරයි.

- අපද්‍රව්‍ය බොහොමයක් (දිනකට ටොන් 12ක්, 54% ක්) නගර සභාවෙන් එකතු කිරීම සඳහා දැනට බැහැර කරනු ලබන අතර, දිනකට ටොන් 0.8ක් ORDE කොම්පෝස්ට් පහසුකම් සපයන ස්ථානය වෙත ද දිනකට ටොන් 11.1ක් අවසාන බැහැර කිරීම සිදු කරන භූමිය වෙත ද රැගෙන යනු ලබයි. අනාගතයේ දී අපද්‍රව්‍ය අවසන් බැහැර කිරීමේ භූමිවලින් හරවා යැවීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම වඩා වැදගත් වේ.

- දෙවනුවට ඉතා බහුළ වශයෙන් භාවිතා කරන බැහැර කිරීමේ ක්‍රමය වන්නේ, ස්ථානීය බැහැර කිරීමයි (දිනකට ටොන් 4.9, 22%). හලාවත නගරයේ බොහෝ ස්ථාන සඳහා (උදා: විශාල පරිශ්‍රයන් සහිත නිවාස, ආයතන, ඉස්සන් වගාවන්/පැටවුන් බෝ කරන ස්ථාන හා ලී මෝල් සඳහා) මෙය සුදුසුය.

- නීත්‍යානුකූල නොවන ආකාරයෙන් බැහැර කිරීම ද බහුළව දැකිය හැකිය (දිනකට ටොන් 4.4, 20%). ඉදිරියේ දී මෙය නවතාලිය යුතුය.

- ප්‍රතිචක්‍රීකරණය තුළින් සම්පත් නැවත ලබා ගැනීම (දිනකට ටොන් 0.9, 4%) සැළකිය යුතු ප්‍රමාණයකින් සිදු වන අතර, ස්ථානීය-කොම්පෝස්ට්කරණය දැනට නොසළකා හැරිය හැකි තරම් ප්‍රමාණයකින් සිදු වේ. මෙම ක්‍රම දෙක තුළින් සම්පත් නැවත ලබා ගැනීම පිළිබඳව ඉදිරියේ දී තවදුරටත් අනුබල දිය යුතුය.




සටහන: ප්‍රතිශතයන් දක්වා ඇත්තේ හලාවත නගර සීමාව තුළ සිදුවන මුළු අපද්‍රව්‍ය උත්පාදනයට සාපේක්ෂවය.

** 2-2 රූප සටහන: හලාවත නගර සභාවේ වර්තමාන අපද්‍රව්‍ය ප්‍රවාහය (2002)

## 2.1.6 බැහැර කරනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය බෙදා දැක්වීම

බිම්පිරවුම වෙත බැහැර කරනු ලබන විවිධ අපද්‍රව්‍ය ප්‍රමාණයන් පහතින් වගු ගත කර ඇත. එමගින් පහත සඳහන් කරුණු පෙන්වනු ලැබේ.

- කඩදාසි හැර, කොම්පෝස්ට්කරණය කළ හැකි කාබනික අපද්‍රව්‍ය ප්‍රමාණය දිනකට ටොන් 7.4 ක් පමණ වේ.
- ඉහළ වටිනාකමකින් යුත් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය (වීදුරු, දෘඩ ප්ලාස්ටික් හා ලෝහ) ප්‍රමාණය 2.4%ක් (පිළිවෙලින් දිනකට ටොන් 0.0, 0.1 හා 0.1) පමණක් වීමෙන් මෙම ද්‍රව්‍ය සියල්ලම පාහේ මෙම අවස්ථාව වනවිට ප්‍රතිචක්‍රීකරණයට ලක් වී ඇති බව පෙන්නුම් කරයි.
- අඩු වටිනාකමකින් යුත් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය (කඩදාසි, රෙදිපිළි හා මෘදු ප්ලාස්ටික්) 11.4%ක් සහ කඩදාසි හා ප්ලාස්ටික් තරමක් වැඩි ප්‍රමාණ වලින් ( පිළිවෙලින් දිනකට ටොන් 0.7

හා0.3) තිබීමෙන් මෙම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ වේගය සාපේක්ෂව අඩු බව පෙන්නුම් කරයි. මෙම ද්‍රව්‍ය අතුරෙන් ප්‍රතිචක්‍රීකරණය සඳහා වැඩි විභවතාවයක් ඇත්තේ,කඩදාසිවලටය (එහෙත් තවමත් සීමා සහිතය). විශේෂයෙන් කඩදාසි මුලාශ්‍රයේදීම වෙන්කර, වෙනම එකතු කළ හැකිය. එසේ නොවුවහොත්, අනෙක් කසළ සමග මිශ්‍ර වූ විට එවා අපිරිසිදු බවට පත් වන අතර, ප්‍රතිචක්‍රීකරණය කිරීමට ඉතා අපහසු වීමත්, එ සඳහා අධික මිළක් වැය වීමත් සිදුවේ.

*** 2-8 වගුව: බැහැර කිරීමට ඇති අපද්‍රව්‍ය ප්‍රමාණ (2002)**

| සමීක්ෂණය කළ කරුණ | අපද්‍රව්‍ය වර්ගය | ප්‍රතිශතය (%) | බැහැර කරන ප්‍රමාණය (T/d) |
|---|---|---|---|
| භෞතික සංයුතිය (තෙත සහිත) | මුළුතැන්ගෙයි | 36.6 | 4.1 |
| | තණකොළ සහ දැව | 29.7 | 3.3 |
| | කඩදාසි | 6.8 | 0.7 |
| | රෙදිපිළි | 1.3 | 0.1 |
| | මෘදු ප්ලාස්ටික් | 3.1 | 0.3 |
| | දෘඩ ප්ලාස්ටික් | 1.0 | 0.1 |
| | සම් සහ රබර් | 0.1 | 0.0 |
| | ලෝහ | 0.8 | 0.1 |
| | වීදුරු | 0.3 | 0.0 |
| | සෙරමික් සහ ගල් | 12.1 | 1.3 |
| | වෙනත් | 8.2 | 0.9 |
| | එකතුව | 100.0 | 11.1 |
| රාශි ඝණත්වය | | 0.20kg/l | |




**** 2-3 රූප සටහන : දිනපතා බැහැර කිරීමට ඇති ප්‍රමාණ (2002)**

## 2.2 හළාවත නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආයතනික සැකැස්ම

හළාවත නගරය තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු කිරීමේ සමස්ත වගකීම නගර සහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. අදාළ වගකීම් වනුයේ:

- කසළ එකතු කිරීමේ මාර්ග සැළසුම් කිරීම සහ එකතු කිරීමේ වාහන සඳහා දිනපතා කාලසටහන් සකස් කිරීම ඇතුළුව හළාවත නගර සීමාව තුළ නාගරික ඝණ අපද්‍රව්‍ය (MSW) කළමනාකරණ කටයුතු සිදු කිරීම.
- එකතු කරන ලද නාගරික ඝණ අපද්‍රව්‍ය (MSW), ORDE කොම්පෝස්ට් කර්මාන්තය වෙත හා අවසාන බැහැර කිරීම සිදු කරන භූමි වෙතට ප්‍රවාහනය කිරීම.
- මහජන වෙළඳපොලවල් පිරිසිදු කිරීම සහ එවායින් කසළ ඉවත් කිරීම.
- සෙප්ටික් ටැංකි සහ වැසිකිළි හිස් කිරීමේ සේවා සැළසීම.
- මාවත්, කාණු සහ පොදු ස්ථාන (උදා: උද්‍යාන) පිරිසිදු කිරීම[5].
- සපයන ලද සේවා සඳහා අදාළ සියළුම ඝ.අ.ක. අයබදු එකතු කිරීම.
- ඝ..අක. හා සම්බන්ධ පළාත් පාලන ආයතන ආඥා පණත් සහ ජාතික නීති ක්‍රියාත්මක කිරීම.
- අපද්‍රව්‍ය අවම කිරීම, ප්‍රතිචක්‍රීකරණය, මහජන අධ්‍යාපනය හා දැනුවත් කිරීම, ආදියට සම්බන්ධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

### 2.2.1 ආයතනික ව්‍යුහය

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැනට පවතින (2002 අගොස්තු) ආයතනික ව්‍යුහය පහත සඳහන් රූප සටහනෙහි පෙන්වා ඇත. ඝ.අ.ක. ඇතුළුව හ.න.ස.වේ සියළුම අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම්වල සමස්ත වගකීම ජ්‍යෙෂ්ඨ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා (SPHI) සතු වේ.දෙවන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් මෙම රාජකාරි ඉටුකිරීම සඳහා ඔහුට සහාය වේ.ආයතනික මට්ටමේ මීළඟට පරිපාලකවරුන් 6 දෙනෙක් සිටින අතර(ස්ථිර දෙදෙනෙක් සහ වැඩබලන හතර දෙනෙක් –උසස් කරන ලද කම්කරුවන්), පහත සඳහන් වගුවෙහි විදහා පෙන්වන ආකාරයට එක් එක් පුද්ගලයා විසින් නගරයෙහි විවිධ ප්‍රදේශවල අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා වගකීම දරනු ලැබේ. ඔවුනට පහළ මට්ටමේ රියදුරන් හය දෙනෙක් සහ කම්කරුවන් 69 දෙනෙක් (වැඩබලන සුපවයිසර්වරුන් ලෙසට ක්‍රියාකරන්නන් හැර සියල්ලොම ස්ථිර සේවකයන්) සිටින අතර ඔවුන් විවිධ ප්‍රදේශවල අදාළ කටයුතු සඳහා පත් කර ඇත. මෙම සේවකයන් 69 දෙනාගෙන් පස් දෙනෙක් වෙනත් රාජකාරීන් (එක්කෙනෙක් රියදුරෙක්, දෙදෙනෙක් උද්‍යාන කටයුතු සහ දෙදෙනෙක් කාර්යාල කටයුතු) සඳහා පත්කොට ඇති බැවින්, ඝ.අ.ක. කටයුතු සඳහා යොදවන නියම

[5]. කාණු හා මාවත් පිරිසිදු කිරීම වසංගත රෝග මර්ධන (IDP) සේවාව යටතේ සඳහන් කර ඇත.

කම්කරු පිරිස 64ක් විය යුතු බවට ගණන් බලා ඇත. හළාවත නගර සභාවේ සෞඛ්‍ය ලිපිකරුවෙක් ද සිටින අතර එහි කම්කරුවන් සඳහා වෙන් කරන ලද සේවක සංඛ්‍යාව වන්නේ 77 කි.

සැළසුම් කමිටුව නගර සභාව සඳහා වූ උපදේශක කමිටුවක් වශයෙන් සේවය කරන අතර, එය ඝ.අ.ක. ඇතුළුව සියළුම සෞඛ්‍යය ගැටළු පිළිබඳව කටයුතු කරනු ලබයි. මෙම කමිටුව සඳහා හ.න.ස. කාර්ය මණ්ඩලයේ, සභාපතිතුමා (කමිටු මුලසුන), ලේකම්, පරිසර නිළධාරිනි (කමිටු ලේකම්), ප්‍රජා සංවර්ධන නිළධාරිනි, පෞ.ම.සෞ.ප., වැඩ ඒකකයේ පරිපාලක, ආදායම් නිළධාරි සහ ORDE ආයතනයේ ලේකම් යන අය ඇතුළත් වේ. රැස්වීම් සාමාන්‍යයෙන් මාසිකව පවත්වනු ලැබේ.

## රූප සටහන 2-4: හලාවත නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ ආයතනික සටහන




සටහන්:

1. 2WT = අත්ට්‍රැක්ටර්, 4WT = ට්‍රැක්ටර්, DC = කාණු පිරිසිදු කරන්නා, SW = අමදින්නා, PHI = මහජන සෞඛ්‍ය පරීක්ෂක
2. විශේෂ කළාපයේ කසළ අපහරණ භූමිය වෙත ප්‍රවාහනය කිරීම සඳහා ලොරියක් හා ට්‍රැක්ටරයක් සහ අනෙක් කළාප වල රියදුරන් හවුලේ භාවිතා කරයි.
3. ගලී බවුසරය භාවිතා කරන විට සෞඛ්‍ය හෝ වැඩ අංශයේ ට්‍රැක්ටරයක් හා රියදුරෙක් හවුලේ යොදා ගනී.

** 2-4 රූප සටහන හලාවත නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ ආයතනික සටහන

*** 2-9 වගුව : හ.න.ස.- අපද්‍රව්‍ය කළමනාකරණ අංශයේ කාර්ය මණ්ඩලය සහ උපකරණ බෙදා දැක්වීම**

| ප්‍රදේශය | ම.සෞ.ප. | සුපවයිසර් | රියදුරන් | කම්කරුවන් | | එකතුකරන ස්ථාන | | අත් කරත්ත | වාහන | පොදු වැසිකිළි |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | කාර්යයන් | ගණන | ස්ථිර | තාවකාලික | | | |
| 1 කලාපය | ම.සෞ.ප.වරු දෙදෙනා විසින් මේ සියළුම ප්‍රදේශ ආවරණය කරයි. | 1 | 1 | ලොරි 3, කා.පි. 1, ඇමදීම 1 | 5 | 4 | 9 | 0 | ලොරි 1 | 1 |
| 2 කලාපය | | 1 | 1 | ට්‍ර. 3, අ.ක. 3, කා.පි. 4, ඇමදීම 3 | 13 | 6 | 9 | 2 | ලොකු ට්‍රැක්ටර් 1 (+ නවතා තබන ට්‍රේලර් 1, ප්‍රධානව විශේෂ කලාපය සඳහා) | 1 |
| 3 කලාපය | | 1 | 1 | ට්‍ර. 3, අ.ක. 3, කා.පි. 3, ඇමදීම 3 | 12 | 1 | 12 | 2 | ලොකු ට්‍රැක්ටර් 1 | 1 |
| 4 කලාපය | | 1 | 2 | ට්‍ර. 4, අ.ක. 1, කා.පි. 3, ඇමදීම 3 | 11 | 1 | 15 | 1 | අත්ට්‍රැක්ටර් 2 | 1 |
| 5 හා 6 කලාප | | 1 | 1 | ට්‍ර. 3, කා.පි. 1, ඇමදීම 1 | 5 | 2 | 1 | 0 | ලොකු ට්‍රැක්ටර් 1 | |
| විශේෂ | | 1 | 2 (වෙනත් කලාපවලින්) | මාළු වෙ.ප. 7, එළවළු වෙ.ප. 2, සිල්ලර වෙ.ප. 2, බසාර් 5, බස් නැවතුම 3, පාලම් විදිය 3 | 22 | 1 | 1 | 2 (හවුල් භාවිතය) | ලොරි 1 (පෙ.ව.)<br>ලොකු ට්‍රැක්ටර් 1 (ප.ව.) (වෙනත් කලාප වලින් ගෙන එන ලද) | 1 (මාළු වෙ.ප.- භාවිතා නොකරයි) |
| සෙප්ටික් ටැංකි/ වැසිකිළි/ ව.රෝ.ම. | | 0 | 0 | ග.බ. 2, මදුරු මර්ධනය 3 | 5 | යො.න ැ. | යො.නැ. | | ගලි බවුසර් 1 | |
| බැහැර කරන භූමි | | 0 | 0 | | 0 | යො. නැ. | යො.නැ. | 0 | නැත | |
| හ.න.ස. එකතුව | 2 | 6 (2 සටහන) | 6 (3 සටහන) | | 73 (3 සටහන) | 15 | 47 | 5 | ලොරි 1, ලොකු ට්‍රැක්ටර් 3, අත් ට්‍රැක්ටර් 2, ගලි බවුසර් 1 | 4 |
| වෙන් කළ සේවක පිරිස | | | | | 77 | | | | | |

**සටහන්:**

1. ව.රෝ.ම.=වසංගත රෝග මර්ධන, ම.සෞ.ප.=මහජන සෞඛ්‍ය පරීක්ෂක, කා.පි.=කාණු පිරිසිදු කිරීම, ට්‍ර.=ට්‍රැක්ටර්, අ.ක.=අත්කරත්ත, ග.බ.=ගලි බවුසර්.
2. සුපවයිසර්වරුන් හය දෙනාට ස්ථිර දෙදෙනා (ප්‍රධාන පරිපාලක සහ එක් සුපවයිසර්වරයෙක්) සහ තාවකාලික සුපවයිසර්වරුන් ලෙසට උසස් කරන ලද කම්කරුවන් හතර දෙනෙක් (ස්ථිර කාර්යමණ්ඩලය) අයත්වේ.
3. කම්කරුවන් 73 දෙනාට තාවකාලික සුපවයිසර්වරුන් ලෙසට ක්‍රියාකරන හතර දෙනා සහ වෙනත් කාර්යයන් සඳහා පත්කොට ඇති කම්කරුවන් පස් දෙනා ද අයත්වේ: (රියදුරෙක්, සතුටු උයන (උද්‍යානය) සහ කාර්යාලය සඳහා හතර දෙනෙක්). එබැවින්, නියම කම්කරු පිරිස 73-4-5 = 64 කි.
4. සියළුම කම්කරුවන් ස්ථිර සේවකයන් වන අතර, අනියම් සේවකයන් යොදා ගනු ලබන්නේ ස්ථිර සේවකයන් නොපැමිණි විට පමණි.
5. අත්කරත්ත දෙකක් විශේෂ කලාපය තුළ භාවිතා කරන අතර, ඒවා විවිධ ප්‍රදේශ අතර හවුලේ භාවිතා කරනු ලැබේ.

## 2.2.2 අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා භාවිතා කරනු ලබන උපකරණ

වර්තමාන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා යොදා ගනු ලබන වාහන සමූහයේ සහ ඒ සඳහා උපකාරී වන උපකරණ පිළිබඳ තොරතුරු, හ.න.ස. කාර්ය මණ්ඩලයේ ප්‍රායෝගික අත්දැකීම් පදනම් කොට ගෙන ඇස්තමේන්තු කරන ලද වාහන ජීව කාලය ද සමග පහත සඳහන් වගුවෙහි සංක්ෂිප්ත කොට දක්වා ඇත.

*** 2-10 වගුව : අපද්‍රව්‍ය කළමනාකරණ වාහන සමූහය සහ ඒ සඳහා උපකාරී වන උපකරණ**

| වාහන/උපකරණ | සංඛ්‍යාව | භාවිතය | ඇස්තමේන්තු ජීව කාලය(වසර) |
|---|---|---|---|
| අත්කරත්ත | 5 | අපද්‍රව්‍ය එකතු කිරීම, මාර්ග සහ කාණු පිරිසිදු කිරීම. | 3-5 |
| අත්ට්‍රැක්ටර් | 2 | 2- ඝ.අ.ක. | 15-20 |
| ලොකු ට්‍රැක්ටර් (4WT) | 5 | 3-ඝ.අ.ක.<br>2- වැඩ ඒකකය (මාර්ග ඉදිකිරීම්/නඩත්තු) | 15-20 |
| ලොකු ට්‍රැක්ටර් ට්‍රේලර් | 6 | 4-ඝ.අ.ක.<br>2- වැඩ ඒකකය (මාර්ග ඉදිකිරීම්/නඩත්තු) | 8-10 |
| ELF 350 ලොරි | 1 | ප්‍රධාන ලෙස ඝ.අ.ක., නමුත් විවිධ වෙනත් කාර්යයන් සඳහා ද යොදා ගනී. | 10-20 |
| ගලි බවුසර් | 1 | සෙප්ටික් ටැංකි/පොදු වැසිකිළි හිස් කිරීම. | 10-12 |
| වතුර බවුසර් | 1 | වතුර බෙදාහැරීම. | 10-12 |

*** 2-11 වගුව : වාහන කම්කරුවන් සහ උපකරණ පිළිබඳ තොරතුරු**

| වාහනය/කාර්යය | කම්කරුවන් | උපකරණ |
|---|---|---|
| අත්කරත්ත | අත්කරත්තයකට 1-2 | රේක්කය, කුඩා කූඩ 1-2, ඉදල් 1-2 (සේවකයන් එක් කෙනෙක් නම් 1, දෙන්නෙක් නම් 2) |
| අත්ට්‍රැක්ටර් | අත්ට්‍රැක්ටරයකට 2 | උදැල්ල, රේක්කය, සවල, කුඩා කූඩ 2, ඉදල |
| ලොකු ට්‍රැක්ටර් | ලොකු ට්‍රැක්ටරයකට 3 | රේක්කය, මුල්ලුව, සවල, කූඩ 1-2ක් |
| ලොරි | ලොරියකට 3 | රේක්කය, මුල්ලුව, සවල, කූඩ 2ක් |
| අමදින්නන් | 11 | ඉදල |
| කාණු පිරිසිදු කරන්නන් | 12 | සවල, රේක්කය, බුරුසු 1-2, ගම්බූට් සපත්තු |
| මාළු වෙළඳපල | 7 | කූඩ 4, ඉදල් 4, සවල, රේක්කය, වීල් බැරෝව |
| එළවළු වෙළඳපල | 2 | කූඩ 3, රේක්කය, සවල, බුරුසු 2 |
| සිල්ලර බඩු වෙළඳපල | 2 | කූඩ 2, සවල, රේක්කය, වීල් බැරෝව |
| බසාර් | 5 | රේක්ක 3, මුල්ලුව, සවල් 3 |
| බස් නැවතුම | 3 | කූඩ 2 |
| පාලම වීදිය | 3 | කූඩ 2 |

**සටහන්:**

1. ගම්බූට් කාණු පිරිසිදු කරන්නන්ට පමණක් සපයනු ලැබේ.
2. කම්කරුවන්ට අත්වැසුම් සපයන නමුත් (වසරකට කට්ටල 4ක්), ඒවා ප්ලාස්ටික් වලින් සාදා තිබීම සහ පැළඳ සිටීමට අපහසුවීම නිසා ඔවුන්ගෙන් ඉතා සුළු පිරිසක් පමණක් ඒවා පළඳිනු ලබයි.
3. නිල ඇඳුම් කට්ටල දෙකක් සෑම වසරකම සියළුම කම්කරුවන්ට සපයන අතර, පිරිමින් සඳහා කාකි කොට කලිසම් සහ කමිසද, ගැහැණුන් සඳහා සුදු සාරිද සපයා ඇත.

## 2.2.3 හ.න.ස. අපද්‍රව්‍ය කළමනාකරණ සේවා කම්කරු පිරිස සහ උපකරණ

### 2.2.3.1 අපද්‍රව්‍ය එකතු කිරීම

හ.න.ස.වේ කසළ එකතු කිරීමේ කම්කරු පිරිස සහ උපකරණ පහත සඳහන් ආකාරයෙන් සමන්විත වේ.

- අත්කරත්ත 5ක්, අත්ට්‍රැක්ටර් 2ක්, ලොකු ට්‍රැක්ටර් 3ක් සහ එක් ELF 350 ලොරියක්,

- පරිපාලකවරුන් 6ක්, රියදුරන් 6 න් හා ස්ථිර කම්කරුවන් 64 න් යුත් මෙම පිරිස තුළ, 90%ක් දෙමළ හා 10%ක් සිංහල අය වේ. ස්ථිර කම්කරුවන් සේවයට නොපැමිණෙන අවස්ථාවල යොදා ගැනෙන අනියම් කම්කරුවන් පිරිසක්ද නගර සභාවට අයත් වේ.

2.2.3.2 වෙළෙඳපොළ

හළාවත නගරයේ පොදු වෙළඳපල තුනෙහි (මාළු, එළවළු සහ සිල්ලර වෙළඳපල වල) අපද්‍රව්‍ය එකතු කිරීම සහ පිරිසිදු කිරීම සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පාලනය කරනු ලබන අතර, මෙම කාර්යය සඳහා පරිපාලකවරයෙක් (විශේෂ කලාපයේ සුපවයිසර) සහ කම්කරුවන් 11 දෙනෙක් දහවල් සහ සවස වැඩමුර සඳහා යොදවා ඇත. සාමාන්‍යයෙන් වෙළඳපල අපද්‍රව්‍ය එකතු කරනු ලබන්නේ වෙනත් කළාපයකින් පැමිණෙන ලොකු ට්‍රැක්ටරයක් මගිනි.

2.2.3.3 මාවත් සහ කාණු පිරිසිදු කිරීම

සාමාන්‍යයෙන් මාවත් සහ කාණු පිරිසිදු කිරීම ඒ සඳහා පත් කළ කම්කරුවන්ට පැවරෙන අතර, කළින් දැක්වූ රූප සටහනෙහි පෙන්වා ඇති ආකාරයට කම්කරුවන් 11 දෙනෙක් සහ 12 දෙනෙක් විවිධ කළාපවල පිළිවෙලින් ඇමදීමේ සහ කාණු පිරිසිදු කිරීමේ රාජකාරි සඳහා නියම කොට ඇත. සාමාන්‍යයෙන්, කාණු පිරිසිදු කරන්නන්ගේ නියම ගණන මෙම ගණනට වඩා සැළකිය යුතු ප්‍රමාණයකින් අඩුය. ඇතැම් කළාපවල කාණු පිරිසිදු කරන්නන් දිනපතා පිරිසිදු කිරීම සඳහා යොදවනු වෙනුවට දවසේ එක් කොටසක දී හෝ සතියකට දින කිහිපයක දී පමණක් පිරිසිදු කිරීම සඳහා නියම කර ඇත.

2.2.3.4 පූතික වලවල් (සෙප්ටික් ටැංකි) හා වැසිකිළි හිස'කිරීමේ සේවා සහ වසංගත රෝග මර්ධන (IDP) සේවා

මේ යටතට පහත සඳහන් සේවා අයත් වේ:

- පොදු වැසිකිළි කළමනාකරණය සහ නඩත්තුව.
- ඉල්ලීම් අනුව හළාවත නගරය තුළ සහ පිටත පිහිටි ඇතැම් ස්ථාන සඳහා ගලි බවුසර සේවා සැපයීම.
- මදුරු මර්ධනය (දියර ඉසීම).

පූතික වළවල් (සෙප්ටික් ටැංකි),වැසිකිළි හිස් කිරීමේ හා වසංගත රෝග මර්ධන (IDP) සේවා සඳහා යොදා ගනු ලබන උපකරණ සහ කම්කරු පිරිස සමන්විත වනුයේ පහත සඳහන් ආකාරයටය.

- පොදු වැසිකිළි 4ක් හා මෙයට අමතරව එක් වැසිකිළියක් මාළු වෙළෙඳපලෙහි තිබෙන නමුත්, අළුත්වැඩියා කිරීමට අවශ්‍යව ඇති බැවින් සහ ජල සැපයුමක් නොමැති බැවින් එය භාවිතා නොකරයි.
- ගලි බවුසරයක්.

- කම්කරුවන් දෙදෙනෙක්. ගලි බවුසරය පසුගිය මාස 12 පුරා බොහෝ අවස්ථාවලදී සේවයෙහි යෙදිය නොහැකිව තිබුණු බැවින්, මෙම කම්කරුවන් වෙනත් කාර්යයන් සඳහා නියම කර ඇතැයි විශ්වාස කෙරේ.
- මදුරු මර්ධනය (දියර ඉසීම) සඳහා කම්කරුවන් තිදෙනෙක්.

පොදු වැසිකිළිවලින් තුනක් පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම පුද්ගලික අංශය මගින් සිදු කරන අතර, සිල්ලර වෙළඳපලෙහි වැසිකිළිය හ.න.ස. මගින් පිරිසිදු කරනු ලැබේ.

### 2.2.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වියදම්

පහතින් වගු ගත කර ඇති හළාවත නගර සභා 2002 අයවැය මගින්, නගර සභා අයවැයට අනුව 35%ක් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වෙන් කර ඇති බව පෙන්නුම් කරයි. ප්‍රධාන වශයෙන් මෙසේ වී ඇත්තේ, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා සේවකයින් වැඩි සංඛ්‍යාවක් (මුළු ගණනින් 30%ක්) සම්බන්ධ වී ඇති බැවිනි. හළාවත නගර සභාව මගින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අයවැයෙන් වෙන් කරන මුදල ප්‍රතිශතයක් වශයෙන් ගත් විට අධ්‍යයනය කරන ලද සියළුම නගර අතුරින් ඉහළම අගය ගන්නා අතර (සාමාන්‍යය=22.0%, 13-35%ත් අතර පරාසය), සේවක පිරිසට අනුව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වෙන් කළ සේවකයන් ගණන සාමාන්‍ය වේ(සාමාන්‍යය=29%, 22-37%ත් අතර පරාසය).

* 2-12 වගුව: හළාවත නගර සභා අයවැයට අනුව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පිරිවැය හා සේවක සංඛ්‍යාව (2002)

| අංශය | ඝණඅපද්‍රව්‍ය කළමනාකරණය (SWM) | හළාවත නගර සභා මුළු ගණන | ඝ.අ.ක. මුළු ගණනෙහි %ක් ලෙස |
|---|---|---|---|
| අයවැය වියදම (රු. මිලියන) | 10,936,000 | 31,695,000 | 34.5 |
| නගර සභා සේවක සංඛ්‍යාව (මුළු සේවක පිරිසෙන්) | 77 | 261 | 29.5 |

### 2.2.5 අපද්‍රව්‍ය එකතු කිරීමේ හා බැහැර කිරීමේ ගාස්තු

අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා ගාස්තුවක් ගෙවනු ලබන්නේ නීල් ප්‍රනාන්දු සහ සමාගම (බෝට්ටු අංගනය, රිදීවැල්ල) පමණකි. (මසකට රු. 350ක)

ගෙවතු අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා නිවාසයකින් එක් පැටවුම් වාරයකට රු. 100ක් අය කිරීම සිදු කරයි. 2001-සිට 2002 දක්වා වූ මාස 12 තුළ මෙම මුදල ගෙවා ඇත්තේ මිනිසුන් 25 දෙනෙකුට ආසන්න ගණනක් පමණකි. පුද්ගලයින් බහුතරයක් මෙම ක්‍රමය අනුගමනය නොකරති, ඔවුන්ගේ ගෙවතු අපද්‍රව්‍ය තම දේපළවලින් පිටතට බැහැර කරනු ලැබීම හෝ එකතු කරවනු ලැබීම සඳහා දේශපාලන උපකාර බලාපොරොත්තු වීම දැකගත හැකිය.

2001-02 යන මාස 12 කාලය තුළ බොහෝ අවස්ථාවල දී ගලි බවුසරය අබලන්ව තිබීම නිසා, ඒ මගින් කිසිදු මුදලක් අයකර ගැනීමට නොහැකි විය.

කෙසේ නමුත්, කසළ එකතු කරන කම්කරුවන්ට අනියම් ආකාරයෙන් ගෙවනු ලැබීම බහුළ වශයෙන් සිදු වන අතර, පහත සඳහන් කරුණු ඊට ඇතුළත් වේ:

- සමීක්ෂණය කරන ලද නිවාස 120න් 24%ක් සාමාන්‍යයෙන් වසරකට රු. 85ක සුළු දීමනාවක් හෝ වසරකට රු.75ක පාරිතෝෂිකයක් ගෙවනු ලබයි.
- සමීක්ෂණය කරන ලද වාණිජ,කාර්මික හා ආයතන 39න් 6ක් සාමාන්‍යයෙන් වසරකට රු.720ක් (වසරකට රු. 100 ක සිට 2,000 දක්වා පරාසයක) මුදලක් ගෙවනු ලබයි.

### 2.2.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු-ව්‍යවස්ථා

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකාවේ සම්මත අතුරු-ව්‍යවස්ථා නියමිත ස්ථානවල ඇතත්, ඒවා බොහොමයක් ඉතා පැරණි හා කල් ඉකුත් වූ ඒවාය. අතුරු-ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීම අසතුටුදායක මට්ටමක පවතින අතර බොහෝ පුද්ගලයින් නීති විරෝධී පුරුදු අනුගමනය කරමින් සිටී[6]

### 2.2.7 හළාවත නගර සභා වැඩපොළ

වාහන අළුත්වැඩියා කිරීමේ හෝ කාර්මික වැඩපළ පහසුකමක් හෝ හළාවත නගර සභාව සතුව නැත. එබැවින්, වාහන අළුත්වැඩියා කිරීමට අවශ්‍ය වන විට අවශ්‍ය කාර්යය සඳහා මිළ ගණන් කැඳවනු ලැබේ. අදාළ අළුත්වැඩියාවේ වටිනාකම අනුව අනුමැතිය ලබා දීමේ ක්‍රියාපටිපාටිය වෙනස් වන අතර, අවම වශයෙන් මිළ ගණන් 3ක් වත් කැඳවා ගත යුතුය. රු. 2,000 දක්වා වටිනාකමින් යුත් අළුත්වැඩියා සඳහා නගර සභා ලේකම්තුමාටද රු. 10,000 දක්වා වටිනාකමින් යුත් අළුත්වැඩියා සඳහා සභාපතිතුමාටද අනුමැතිය දීමේ හැකියාව ඇති අතර, රු. 10,000 ට වැඩි ඕනෑම අළුත්වැඩියාවක් සඳහා සභාව මගින් අනුමැතිය ලබා ගත යුතුය. සාමාන්‍යයෙන් අවශ්‍ය කාර්යය කිරීම සඳහා මිළ ගණන් කැඳවූම් අතරින් අඩුම මිළ ගණන් දැක්වූ ස්ථානය තෝරා ගනු ලැබේ. ටෙන්ඩර් පරිපාටිය සඳහා සාමාන්‍යයෙන් සති දෙකක් පමණ ගතවන අතර, බොහොමයක් අළුත්වැඩියා නිම කිරීම සඳහා සති දෙකක්[7] ගත වන බැවින්, අළුත්වැඩියාව සිදු කරන කාලය අතරතුර දී එම වාහන මසක පමණ කාලයක් භාවිතයෙන් ඉවත දමා තිබීමට හේතු සාධක වේ.

වාහන නඩත්තුව හා අළුත්වැඩියා කිරීම සඳහා වැය වන මුළු මුදලින් 70%ක්ම වැය වන්නේ ඝ.අ.ක. වාහන නඩත්තුව සඳහා බව හළාවත නගර සභාව විසින් ඇස්තමේන්තු කර ඇත.

[6] කෙසේනමුත්, නගර මධ්‍යයෙහි සිටින ඇතැම් වානිජ ව්‍යාපාරිකයන් ඔවුන්ගේ කසළ පාර අද්දර වූ කාණු වලට විසි කිරීම නිසා ඔවුන්ට විරුද්ධව නඩු කිහිපයක් පවරා ඇත. මෙය මෙම ප්‍රදේශයේ කසළ බැහැර කිරීමේ චර්යාවන් යම් පමණකින් වැඩිදියුණු කිරීමට හේතු වී ඇත.

[7] අළුත්වැඩියා කටයුතු සඳහා නගර සභාවෙන් අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය වන විට (එනම්,රු. 10,000ට වැඩි) ටෙන්ඩර්/අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා සති දෙකකට වඩා සැළකිය යුතු තරම් වැඩි කාලයක් ගත විය හැකි බව අනෙක් නගර සභා වලින් ලබා ගෙන ඇති අත්දැකීම් අනුව හැගවේ.

# 2.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක සංරචක

## 2.3.1 බැහැර කිරීම, එකතු කිරීම හා ප්‍රවාහනය

### 2.3.1.1 අපද්‍රව්‍ය එකතු කිරීමේ කළාප

පිරිසිදු කිරීමේ හා කාණු පවිත්‍ර කිරීමේ අරමුණ ඇතිව නගරය කළාප 6ට බෙදා ඇත. ඊට අමතරව නගරයේ වාණිජ මධ්‍යස්ථානය ආවරණය කරමින්, කළාප අංක 2, 4, හා 6 යේ කොටසක්ද ඇතුළත්ව විශේෂිත කළාපයක්ද නම් කර තිබේ. මෙම කළාපවල වැදගත් ලක්ෂණයන් උපකාරක වාර්තාවේ සාරාංශගත කර තිබේ.ක්ෂේත්‍ර සමීක්ෂණ හා නගර සභා කාරය මණ්ඩලය සමග කරන ලද සාකච්ජාවලින් ලැබු තොරතුරු අනුව හලාවත නගරයේ කසළ එකතු කිරීමේ සේවා ආවරණය ජනගහණයෙන් 75%-85% අතර වන බව පෙන්නුම් කරයි. මෙම අධ්‍යයනය තුළදී, ආවරණය කිරීමේ සාමාන්‍ය ප්‍රතිශතය 80% ලෙසට භාවිතා කෙරේ.

### 2.3.1.2 හලාවත නගර සභාව තුළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිය

අපද්‍රව්‍ය උත්පාදනය කරන බහුතරයක්, පහත සඳහන් ආකාරයන්ගෙන් එක් ක්‍රමයකට සියළුම අපද්‍රව්‍ය මිශ්‍රව බැහැර කරයි.

- නගරය තුළ පිහිටා ඇති සෘජුකෝණාශ්‍ර හැඩයෙන් යුත් සංඛ්‍යාවෙන් 15ක් පමණ වන ස්ථිර කසළ බක්කිවලට මාරු කිරීමට හෝ නගර මධ්‍යයේ තබා ඇති නිශ්චල ට්‍රේලර්වලට දැමීම සඳහා අත් කරත්තවලින් කෙරෙන ප්‍රාථමික එකතු කිරීම්වලදී රැගෙන යාම පිණිස පාර අයිනට දැමීම.
- කෙළින්ම මෙම කසළ බක්කිවලට හෝ එකතු කිරීමේ ස්ථානවලට බැහැර කිරීම
- ස්ථිර කසළ බක්කි නැතත්, පදිංචිකරුවන් විසින් පාර අයිනේ තාවකාලිකව කසළ බැහැර කිරීම සඳහා යොදාගන්නා ස්ථාන 47 ට වඩා හඳුනාගෙන තිබේ.

සමහර පුද්ගලයින් විසින් කසළ බැහැර කිරීම සඳහා ප්ලාස්ටික් මල්ලක් හෝ කසළ බඳුනක් යොදා ගත්තද, බොහෝවිට කරන්නේ සෘජුවම කසළ බක්කියට හෝ බිමට බැහැර කිරීමයි. වාණිජ ස්ථාන කිහිපයකින් හා නිවෙස් සුළු ප්‍රමාණයක් තම අපද්‍රව්‍ය නගර සභාවේ එකතු කිරීමේ වාහනයට සෘජුවම ලබා දෙන අතර සමහර වාණිජ හා ව්‍යාපාරික ස්ථානවල කසළ එකතු කිරීම සඳහා එම ස්ථානවලට යාමට සිදු වේ. කසළ බැහැර කිරීමේ විවිධ ක්‍රම පිළිබඳව වැඩි විස්තර උපකාරක වාර්තාවේ විස්තර කර ඇත.

ඉහත සඳහන් ආකාරයට කසළ බැහැර කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් කසළ විශාල වශයෙන් විසිරීම, කුඩා කසළ භූමි ඇතිවීම, හා ආහාර සොයා යන එළුවන්, හරකුන්, හා බල්ලන් බළලුන් වැනි සතුන් විසින් කසළ විසිරවීම නිසා දුර්වල සනීපාරක්ෂක තත්ත්වයක් මතුවීම වැළැක්විය නොහැක. දැනටමත් සමහර බක්කිවල කොටස් අවට සිටින නේවාසිකයින් විසින් කඩා බිඳ දමා ඇත.

එසේම නගරය තුළ විශාල ලෙස එක්වන ගෙවතු අපද්‍රව්‍ය නීති විරෝධී ආකාරයට කසළ එකතු කිරීමේ පොදු ස්ථානවලටම බැහැර කරන අතර පසුව නගර සභාව විසින් එවා එකතු කරගෙන යනු ලැබේ. එහිදී වැඩිපුර දක්නට ඇත්තේ පොල් අතු වන අතර කළාප අංක 5-6 හා අඩු ආදායම් නිවාස ප්‍රදේශවල මෙය වැඩි වශයෙන් දක්නට ඇත.

සෞඛ්‍ය ගැටළු මෙන්ම මහත් හිරිහැරයක් ඇති කරමින් බොහෝ කාණු පද්ධතීන් කසළ වලින් පිරී තිබීම හෝ අවහිර වී තිබීමද දැකිය හැක.

මෙම නිරීක්ෂණ තුළින් විදහා දැක්වෙන්නේ වත්මන් බැහැර කිරීමේ පද්ධතිය ඉතා ඉක්මනින්ම ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් ඇති කරන බවයි.

2.3.1.3 හළාවත නගර සභාවේ කසළ එකතු කිරීමේ පද්ධතිය

**a. එකතු කිරීමේ පද්ධතිය**

උපකාරක වාර්තාවේ සඳහන් පරිදි කසළ එකතු කිරීම, විධිමත් හා අවිධිමත් එකතු කිරීමේ ස්ථානවලින් මෙන්ම බැහැර කරන්නා වෙතින් කෙරෙන සෘජු ලබා ගැනීම්වලින්ද සමන්විතය. එකතු කිරීමේ වාර ගණනේ පරාසය දිනපතා (ප්‍රධාන පාර, වාණිජ මධ්‍යස්ථානය, හා සමහර නේවාසික ප්‍රදේශ ) හා සිට මුරමාරු ක්‍රමයකට (උදා. මැල්පුර, සේද උයන පටුමග, වටවන පාර හා මැදවත්ත ප්‍රදේශය) සිදු කෙරේ

අපද්‍රව්‍ය එකතු කිරීමේ කම්කරුවන් එවා පැටවීම සඳහා නගර සභාවෙන් සපයා ඇති කූඩා වෙනුවට බොහෝවිට භාවිතා කරන්නේ පොහොර මලුය. සාමාන්‍යයෙන් එම මල්ල බිම අතුරා, එක් සේවකයෙක් රේක්කයක් හෝ මුල්ලුවක් ආධාරයෙන් ඒ මතට කසළ එකතු කරන අතර ඉතිරි දෙදෙනා එය දෙපැත්තෙන් ඔසවා වාහනයට පටවයි.

ඉතා පටු පාරවලින් යුක්ත අඩු ආදායම් හා ජන ඝණත්වය අධික ප්‍රදේශවල(කළාප අංක 1 එක් කොටසක) පෙට්ටි කඩ සෑදීමෙන් මාර්ග අවහිර වීම නිසා වාහන මගින් කසළ එකතු කිරීම අති දුෂ්කර වී තිබේ.

2002 අගෝස්තු මස ජයිකා අධ්‍යයන කණ්ඩායම විසින් කසළ එකතු කිරීම සඳහා කාල නිර්ණ අධ්‍යයනයක් කරන ලදී, ඒ අනුව ට්‍රැක්ටර රථයක් එක් වාරයක් නිම කිරීම සඳහා පැය 2. විනාඩි 43ක් ගත කළ අතර පැටවීම සඳහා ගත වූ මුළු කාලයෙන් 73% ක් වැය කර තිබිණ.

**b. හ.න.ස. වේ කසළ එකතු කිරීමේ වාහන සඳහා ඒකක පිරිවැය**

නගර සභාවෙන් සපයන ලද සත්‍ය පිරිවැය දත්ත, නියමිත වාර ගණන(2002-8-14) හා අවශ්‍ය පරිදි අනෙකුත් මූලාශ්‍රවලින් ලබා ගත් අතිරේක දත්ත පාදක කර ගනිමින් කසළ එකතු කිරීම සම්බන්ධයෙන් අත් කරත්ත, ලොරි හා ට්‍රැක්ටර්වලට යන වියදම ගණනය කරන ලදී, එම වියදම පහතින් පෙන්නුම් කර තිබේ. වැඩි විස්තර උපකාරක වාර්තාවේ දක්වා ඇත.




** 2-5 රූප සටහන: හලාවත නගර සභාවේ ඝ.අ.ක. වාහනවල වත්මන් එකක මිළ

මෙම දත්ත අනුව,

- සාමාන්‍යයෙන් නිශ්චල ට්‍රේලරවලට අපද්‍රව්‍ය පටවන අත් කරත්තයක් දිනකට වාර 5ක් සම්පූර්ණ කිරීමට සමත් වේ. මෙහිදී අත් කරත්තයක එකක පිරිවැය එක් කම්කරුවෙකු සමඟ (ටොන්/රු. 391) සාධාරණ බව කිව හැකි නමුත් කම්කරුවන් දෙදෙනෙකු යොදා ගත්විට (ටොන්/රු.749) එය ඉහළ අගයක් ගනී.

- අත්කරත්තයක් එක් කම්කරුවෙකු යොදා අවසන් බැහැර කිරීම සඳහා කෙරෙන සෘජු ප්‍රවාහනයකදී දිනකට වාර 2.8ක් සම්පූර්ණ කළ හැකි අතර ඉතා ඉහළ එකක පිරිවැයක් (ටොන්/රු.689) දරයි. කම්කරුවන් දෙදෙනෙකු සමඟ එය ටොන් එකකට රු. 1,322 දක්වා ඉහළ යයි.

- ට්‍රැක්ටරයේ හා ලොරියේ එකක පිරිවැය සමාන අතර, රෝද 4 ට්‍රැක්ටරයක පිරිවැය තරමක් පහළය(ටොන්/රු. 629). ලොරියේ එකක පිරිවැය තරමක් ඉහළ අගයක් ගනී(ටොන්/රු.772). මෙයට හේතුව ට්‍රැක්ටරයේ ධාරිතාවය ලොරියට වඩා තරමක් වැඩි බැවිනි.(වරකට ටොන් 1.08 හා 0.81/ සංසන්දනය කිරීමේදී). අනෙකුත් නගරවල කරනු ලැබූ සමීක්ෂණ දත්ත හා සසඳා බැලීමේදී මෙහි ට්‍රැක්ටරය හා ලොරිය සඳහා වන එකක පිරිවැය ඉහළ අගයක් ගන්නා බව කිව හැකිය.

c. **ඇගයීම**

කසළ එකතු කිරීමේ වත්මන් ස්වභාවය දෙස බැලූවිට ඒ සඳහා දරන උත්සාහය අපතේ හරින්නක් බව පෙන්නුම් කරයි. අත් කරත්තවලින් මූලික වශයෙන් එකතු කරන කසළ කොන්ක්‍රීට් බක්කිවලට ගෙන ගොස් දමයි. ට්‍රැක්ටර කම්කරුවන් විසින් බක්කි තුළට දැමූ එම කසළ නැවතත් ට්‍රැක්ටරවලට පටවනු ලැබේ. මිනිසුන් විසින් බිමට හෝ බක්කි තුළට දැමූ කසළ කම්කරුවන් විසින් ට්‍රැක්ටරවලට පැටවීම සඳහා සෑහෙන වේලාවක් ගත කරයි. පොදු කසළ බක්කි බොහොමයක්ම නිර්මාණය කර ඇත්තේ දුරවල අන්දමකටය. මෙවැනි පද්ධතියක් තිබීමෙන් කසළ එකතු කිරීමේදී එකම ක්‍රියාවලිය දෙවතාවක් කිරීමට සිදුවීම හා පැටවීමට බොහෝ වේලාවක් ගත කිරීමටද සිදු වේ.

අනෙක් ප්‍රධාන ගැටළුව වන්නේ කසළ එකතු කිරීමට යොදා ගන්නා ට්‍රැක්ටර ඉතා පරණ ඒවා වීම (සාමාන්‍ය ආයු කාළය: රෝද 2 ට්‍රැක්ටර-වසර 8 , ලොරිය වසර 12, රෝද 4 ට්‍රැක්ටරය වසර 6 හා ට්‍රේලරය වසර 5.2) හා නිතර නිතර දෝෂ ඇති වන අතර ඒවා අළුත්වැඩියා කිරීමට සැහෙන කාළයක් ගත වීම.

ගණනය කරන ලද මෙම ඉහළ ඒකක පිරිවැය තුළින් පෙන්නුම් කරන්නේ කම්කරුවන් සංඛ්‍යාව අඩු කිරීමෙන්, දෛනික වාර ගණන වැඩි කිරීමෙන් හා එකතු කිරීමේ කාර්යක්ෂමතාවය ඇති කිරීම තුළින් අත් කරත්ත, ලොරිය හා ට්‍රැක්ටර සඳහා යන ඒකක පිරිවැය සැළකිය යුතු මට්ටමකින් අඩු කිරීමේ විභවතාවයක් ඇති බවයි.

## 2.3.2 සැකසීම හා ප්‍රතිකර්ම යෙදීම

ORDE[9] ආයතනය, පරිසර අමාත්‍යාංශයේ රු. මිලියන 1.85 මූල්‍යාධාර ඇතිව කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී, හළාවත නගරයෙන් කි.මී. 2-3 එපිට මුන්නේශ්වරම අසළ පිහිටා ඇති අතර එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබුවේ වසර 2001 ජූනි මසදීය. ඒ පිළිබඳ මූලික කරුණු පමණක් මෙහි සාරාංශගත කර ඇති අතර වැඩි විස්තර උපකාරක වාර්තාවේ සඳහන් කර ඇත.

එය සැළසුම් කර ඇත්තේ හළාවත නාගරික අපද්‍රව්‍ය, දිනකට/ ට්‍රැක්ටර පැටවුම් 10ක් (දිනකට ටොන් 4ක් පමණ) හැසිරවිය හැකි ආකාරයෙනි. එහි මෙහෙයුම් කටයුතු සිදු වී ඇත්තේ මුළු ධාරිතාවයෙන් පහළ මට්ටමක අතර මුළු කාලසීමාවෙන් 50% ක් පමණ දැනට භාවිතා කර ඇත. උදා. ලෙස 2002 ජූලි හා අගෝස්තු මාසවලදී සමීක්ෂණය සිදු කරන විට එහි කොම්පෝස්ට් සෑදීම සඳහා නාගරික අපද්‍රව්‍ය යොදා ගත්තේ දිනකට ටොන් 0.81 පමණ ප්‍රමාණයකි.

මෙම කොම්පෝස්ට් පහසුකම නිසා පරිසරයත් හළාවත නගරය කීපාකාරයකින්ම ප්‍රතිලාභ ලබමින් සිටී.

- සැළකිය යුතු ප්‍රමාණයක කාබනික ද්‍රව්‍ය යොදා කොම්පෝස්ට් සෑදීම තුළින් හළාවත නගර සභාවේ මුදල් හා කාලය ඉතිරි කරන අතර, කොම්පෝස්ට් සෑදීමෙන් ඉතිරිවන ප්‍රතික්ෂේපිත ද්‍රව්‍ය එම ස්ථානයේම පුළුස්සන බැවින් අවසන් බැහැර කිරීම සඳහා කසළ භූමියට යන ප්‍රමාණයද අවම කරයි.
- එසේම අපද්‍රව්‍ය යොදාගෙන ඉහළ තත්ත්වයකින් යුතු ප්‍රයෝජනවත් යමක් (කොම්පෝස්ට්) නිපදවයි.
- කොම්පෝස්ට් සෑදීම සඳහා සේවකයින් බඳවා ගැනීම තුළින් රැකියා අවස්ථා ඇති කරන අතර නිෂ්පාදන ද්‍රව්‍ය විකිණීම තුළින් ආදායමක්ද උත්පාදනය කරයි.

ඊට අමතරව මෙම ව්‍යාපෘතිය අවට ජිවත් වන බහුතරයක් මැස්සන් හා දුගඳ සම්බන්ධයෙන් චෝදනාවන් කිහිපයක් නැගුවද රැකියා අවස්ථාවන් සැපයීම, තම කසළ බැහැර කිරීමට උදව්වීම, කොම්පෝස්ට් ලබා ගැනීමට ඇති හැකියාව ආදී ප්‍රතිලාභ අත්කර දෙන බැවින් මෙම ව්‍යාපෘතිය පිළිබඳ පැහැදීමකින් සිටී[10].

මෙම කරුණු අනුව පෙන්නුම් කරන්නේ ORDE ආයතනය හළාවත නගර සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය තුළ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන බවයි. කෙසේ වෙතත් ආරම්භයේදී මෙහෙයවීම්

---

[9] Organization for Resource Development and Environment, මෙය රාජ්‍ය නොවන සංවිධානයකි.

[10] JICA සමීක්ෂණය : ඒ අවට ජිවත්වන නේවාසිකයින් 20 දෙනෙකු සඳහා 2002 සැප්තැම්බර් මසදී කරන ලද සමීක්ෂණය

කටයුතු කරගෙන යාමේදී මතු වූ බරපතල ප්‍රශ්න නිසා එය නොනැසී පවත්වා ගැනීම සඳහා මහත් අරගලයක් කරමින් සිටිනු දක්නට ලැබිණ.

- එහි නිෂ්පාදනය කරන කොම්පෝස්ට් විකුණා ගැනීමට අපහසු වී තිබේ. එහි විකුණුම් මිළ කි.ග්‍රෑ. එකකට රු. 8 ක් (20% ක වට්ටමක්ද ඇතිව) වන අතර රසායනික පොහොර හා තරග කිරීමටද සිදුව තිබේ(උදා. යූරියා= කි.ග්‍රෑ./රු.14කි. සහනාධාරය ඉවත් කිරීමට පෙර එය කි.ග්‍රෑ. /රු.7ක් විය). එසේම කොහු බත් කි.ග්‍රෑ. එකක් රු. 6.50ක්ද, ගොම පොහොර හෝ පිදුරු කි.ග්‍රෑ. එකක් රු. 1.33 ක්ද, කුකුල් පොහොර කි.ග්‍රෑ. එකක් රු. 1.25 ක්ද වේ.

- වියදම් ආවරණය කර ගැනීමට තරම් ආදායමක් උත්පාදනය කිරීමට අපොහොසත්වීමද ප්‍රධාන ගැටළුවක් විය.උදාහරණ ලෙස, ජනවාරි සිට ජූනි දක්වා එහි අයවැය පරතරය (අඩු ආදායම හා වියදම අතර) මසකට රු. 8400- 22,500 දක්වා පරාසයක විය. මෙම තත්ත්වය දියුණු කළ යුතුව තිබුණද, මූල්‍යමය ගැටළු හේතුවෙන් එය තරමක් අසීරු වී තිබේ.

- කොම්පෝස්ට් සෑදීමට පෙර සිදුවන මූලාග්‍ර තේරීම අධික වියදම් සහිතවූත් කාලය වැයවන්නාවූත් ක්‍රියාවලියකි. ORDE ආයතනයට ලැබෙන්නේ මිශ්‍ර අපද්‍රව්‍ය බැවින් එය තේරීම සඳහා කම්කරුවන් 3-4ක් යොදාගන්නා අතර, එක් ට්‍රැක්ටර පැටවුම් එකක අපද්‍රව්‍ය කොම්පෝස්ට් කළ හැකි හා නොකළ හැකි වශයෙන් කාණ්ඩ දෙකකට වෙන් කිරීම සඳහා පැය 3-4ක් ගත වේ. මේ අනුව බලන විට ට්‍රැක්ටර පැටවුම් එකක් තේරීම රු. 350ක පමණ පිරිවැයකට සමාන කළ හැකිය.

- ORDE ආයතනය හලාවත නගර සභාවේ අපද්‍රව්‍ය බාර ගනු ලැබුවද ඒ සඳහා නගර සභාව විසින් කිසිම ගාස්තුවක් නොගෙවයි. එසේම මධ්‍යම ආණ්ඩුවෙන් හෝ පළාත් ආණ්ඩුවකින් කිසිම මූල්‍යාධාරයක් මෙම ආයතනයට නොලැබේ.

- කොම්පෝස්ට් සෑදීමෙන් ඉතිරිවන ප්‍රතික්ෂේපිත ද්‍රව්‍ය බැහැර කිරීමද ගැටළුවකි.(පැටවුම් එකකට/කි.ග්‍රෑ.125ක් පමණ). දැනට එවා එම ආයතනයේම ස්ථානයක බැහැර කිරීම හෝ පුළුස්සා දැමීම සිදු කරයි.

2003 ජනවාරි මසදී මෙම ආයතනය නේචර්-කෙයා ලංකා නම් වූ පෞද්ගලික සංවිධානයක් සමග එහි අයිතිය එක් වසරක කාල සීමාවකට පැවරීම සඳහා ගිවිසුමක් අත්සන් කරන ලදී, මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා යන වියදම් නේචර් කෙයා ලංකා ආයතනයෙන් ලබා දී තිබේ. එසේම එහි නිෂ්පාදනයන් විකිණීම සඳහා අළුත් වෙළෙඳපලක් සෙවීම සම්බන්ධයෙන්ද එය ක්‍රියාකාරී දායකත්වයක් ලබා දේ. (උදා. කල්පිටිය ප්‍රදේශයේ ගොවීන්ගේ කාබනික වගාව සඳහා සහන මිළකට නිෂ්පාදන ලබා දීම,හෝ අපනයන වෙළෙඳපල සඳහා හඳුන්වා දීම වැනි). කෙසේ වෙතත් මෙම ආයතනයේ තිරසාර පැවැත්ම සඳහා කළ යුතු දෑ බොහෝය.